වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්

வருடாந்த செயலாற்றுகை அறிக்கை மற்றும் கணக்கு

Annual Performance Report & Accounts

2025

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்

Department of Pensions

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

කාර්යසාධන වාර්තාව සහ ගිණුම් - 2025

වැය ශීර්ෂ අංකය- 253

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

මාලිගාවත්ත

කොළඹ10

පටුන

1. ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම 1

1.2.දැක්ම, මෙහෙවර හා අරමුණු 2

1.3.ප්‍රධාන කාර්යයන් 3

1.4.සංවිධාන සටහන 4-5

1.5.දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6

2.ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ව්‍යාපෘති.....7-22

අභියෝග 23

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන්මඟ 23

3. 2025.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 25

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....26

3.3.මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය.....27

3.4.මූල්‍ය ප්‍රකාශ සටහන්.....28

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.....29

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.....29

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙසමෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....30

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.....30

3.9. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම් 31-32

3.10. 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් (පළාත් සභා සහ මධ්‍යම රජය).....33-40

3.11. ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම 41-43

3.12. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගිණුම් 44-45

3.13. විගණකාධිපතිවරයාගේ වාර්තාව.....46-73

4.කාර්ය සාධන දර්ශක

4.1.ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).....75-82

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු.....83

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.....83

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.....85

6.3. මානව සම්පත් සංවර්ධනය.....85-92

7. අනුකූලතා වාර්තාව..... .93-99

01.
ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

වර්ෂ 1970 දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කර ඇති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ශ්‍රී ලාංකීය රාජ්‍ය අංශයේ විශ්‍රාමික ප්‍රජාව වෙත සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හිමිගන්වනු ලබන ප්‍රමුඛතම ආයතනය වේ.

ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් නීතිය මෙරටට නිදහස ලැබීමට පෙර සිටම, එනම් 1898 ජූනි මස 23 දින සිට බලාත්මකව 1898 අංක 01 දරන වැන්දඹු අතත්දරු අරමුදල් ආඥා පනතට අනුව ක්‍රියාත්මක කිරීම ආරම්භ වී ඇත. එතැන් සිට රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් කළමනාකරණය කිරීමේ කාර්යභාරය මහ භාණ්ඩාගාරය යටතේ සිදුවී ඇත.

1934 පෙබරවාරි 05 දින නිකුත් කරනු ලදුව 1972 මැයි 05 දින නැවත ප්‍රතිශෝධනය කොට හා කලින් කල සංශෝධනයන්ට ලක්වූ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත යන අණපනත් මූලික කොට විශ්‍රාමිකයින් සඳහා ප්‍රතිලාභ හිමිගැන්වීී මහා ගෙවීම් කරනු ලබයි. එමෙන්ම 1953 අංක 44 දරන ගුරු වැන්දඹු අනත්දරු අරමුදල් පනත සහපිරිවෙන්, උපකෘත පාසල් සඳහා වූ විශ්‍රාම වැටුප් රෙගුලාසි, 1981 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය හා 1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා)පනත, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයන් ද ක්‍රියාත්මක වේ.

ඉහත නෛතික ප්‍රතිපාදනයන්ට අනුකූලව සිවිල් විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු හා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප්, සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් යන විෂයයන්ට අදාළව සියලු ගෙවීම් හා අයකිරීම් නියාමනය කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යභාරය වේ.

එමෙන්ම ඩිජිටල් තාක්ෂණික උපාය මාර්ග හා සන්නිවේදන නව්‍යකරණයන් හා යාවත්කාලීන වෙමින් මේ වනවිට විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමවේදය සරල කිරීමට හැකියාව ලැබී ඇති අතර 743,000 කට අධික විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ ලබන විශ්‍රාමිකයින්ගේ සහ ඔවුන්ගේ උරුමකරුවන්ගේ ප්‍රතිලාභ තහවුරු කිරීමට මෙන්ම විශ්‍රාම වැටුප් ගෙවීමෙන් ඔබ්බට සමාජ හා ආර්ථික වශයෙන් තෘප්තිමත් විශ්‍රාමිකයකු බිහි කිරීම වෙනුවෙන් පෙර ගමන්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබන මෙම දෙපාර්තමේන්තුව මේ වනවිට අඩ සියවසක් ඉක්මවූ ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අනුකූලව 2025 මුදල් වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිදුකරන ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ කළමනාකරණය හා හිමිගැන්වීමේ ක්‍රියාවලිය හා මූල්‍ය ක්‍රියාකාරකම් හි සාධනීය තත්ත්වය පිළිබඳ විස්තර ඇතුළත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත.

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු



දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්



මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

අරමුණු

- රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු හා අනත්දරු ආඥා පනත හා වැන්දඹු පුරුෂයා අනත්දරු පනතට අනුකූල වන පරිදි හිමිගැන්වීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම හා ඊට අදාල විධිවිධානයන් පැනවීම.
- විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික රාමු, රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණාවලට අනුකූලව රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප හිමිගැන්වීම.
- මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අඛණ්ඩව ගෙවීම හා වික්වරක් පමණක් ගෙවන ප්‍රතිලාභ නිරවද්‍යතාවයකින් යුක්තව හිමි ගැන්වීම.
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය නියාමනය හා ප්‍රතිලාභ හිමි ගැන්වීම.
- රජය වෙනුවෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් රැස්කිරීම හා අනෙකුත් ආදායම් රැස්කිරීම හා කළමනාකරණය කිරීම.
- සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පසු ප්‍රතිලාභ කළමනාකරණය.
- සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ දුබලතාවයට පත්වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන්ට වන්දිවැටුප් හා දීමනා ගෙවීම.
- සමාජ ආරක්ෂණය පිළිබඳ ගෝලීය හා නව්‍යකරණයේ ප්‍රවණතා අධ්‍යයනය කරමින් නූතන සමාජ ආරක්ෂණ ක්‍රමයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහාය වීම.
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා ප්‍රගතිය පිළිබඳව ව්‍යවස්ථාදායකයට වගවීම.
- ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල පැවැත්වීම.

1.3. ප්‍රධාන කාර්යයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ත කාර්යභාරය ක්‍රියාවලි හතරක් ඔස්සේ සිදුකරනු ලැබේ.

1.3.1 විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ප්‍රදානය

I. රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම

රාජ්‍ය සේවකයින්, අධිකරණ, පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරුසහ "ට" උපලේඛනයට ඇතුළත් කර ඇති නිලධාරීන් හට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමි ගැන්වීම.

II.සන්නද්ධ සේවාවන් සඳහා විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම

සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන්ට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමි ගැන්වීම, වන්දි වැටුප් හා දීමනා,දුබලතා විශ්‍රාම වැටුප්, ස්ථාවර මාසික දීමනා හා යැපෙන්නන්ගේ දීමනා හිමි ගැන්වීම.

III. වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම

සිවිල් අධිකරණ හා හමුදා සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මිය යන රාජ්‍ය සේවකයින් සඳහා මරණ පාරිතෝෂික හිමි ගැන්වීම, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම.

IV.රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ හිමි ගැන්වීම

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම.

1.3.2 ගෙවීම් නියාමනය

විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදුකරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම්, උරුමකරු ගෙවීම්, විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත් වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම, විශේෂ වන්දි ගෙවීම්, විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම.


1.3.3 ලැබීම් නියාමනය

මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි සමාජ සංරක්ෂණයන්ට අදාළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ලැබීම්, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ලැබීම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්, ගුරු වැන්දඹු හා අනත්දරු අරමුදලේ දායක මුදල් ලැබීම්,ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය කිරීම.

1.3.4 සංවර්ධන ප්‍රවේශය

රජයේ ප්‍රතිපත්ති රාමුව හා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම ඉලක්ක කරගෙන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහායවීම, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිරන්තර අධ්‍යයනය කිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සේවාලාභීන්ට නැතහොත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධ කර ගනිමින් විශේෂ ප්‍රතිලාභ හිමිගැන්වීම හා රජයේ ඉලක්ක සපුරාගත හැකි වන පරිදි මානව හා භෞතික සම්පත් නිරන්තරව සංවර්ධනය කර ගනිමින් කටයුතු කිරීම.

1.4. සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ මණ්ඩලය (රා.සේ.අ.අ.)
ලේකම් හා ගණකාධිකාරී (රා.සේ.අ.අ)
පරිපාලන නිලධාරී
ශාඛා ප්‍රධානී
සහයක කාර්ය මණ්ඩලය
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී I
ගණකාධිකාරී (දෙපාර්තමේන්තු ගෙවීම්)
ගණකාධිකාරී (ප්‍රතිපාදන)
ගණකාධිකාරී (දායක මුදල්)
ගණකාධිකාරී (මාසික ගෙවීම්)
ගණකාධිකාරී (පාරිතෝෂික)
ගණකාධිකාරී (වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීම්)
ගණකාධිකාරී (විෂමතා)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
වෛද්‍ය උපදේශක
අධ්‍යක්ෂ (සිමිවිල් පරිපාලන හා සේවා)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (කොරතුරු තාක්ෂණ) SLAS
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (කොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) SLITS
අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා විමර්ශන)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති)
නීති නිලධාරී
අධ්‍යක්ෂ (බ.අ.වි.)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (බැ.අ.වි.බැ.)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (බැ.අ.වි.බැ. 11)
අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමධ්‍යගත)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මධ්‍යගත)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සන්නද්ධ සේවය)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්)
අධ්‍යක්ෂ (පාලන)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
ප්‍ර.ක.සේ.නි (මා.ස.)
ප්‍ර.ක.සේ.නි (පාලන)
ශාඛා ප්‍රධානී (කැපැල්)
ශාඛා ප්‍රධානී (1970)
ශාඛා ප්‍රධානී (පාලන)
සහයක කාර්ය මණ්ඩලය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය - 2025.12.31

තනතුරේ ස්වභාවය	තනතුර	අදාළ වන සේවය	වැටුප් ක්‍රමය	අනුමත මූළු තනතුරු සංඛ්‍යාව	සේවයේනියුතු සංඛ්‍යාව	පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්	SLAS (Special)	SL-3-2016	1	1	0
	අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්	SLAS (Special)	SL-3-2016	1	1	0
	ප්‍රධාන මූල්‍ය නිලධාරී	SLAcS (Special)	SL-3-2016	1	1	0
	වෛද්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම)	Primary Grade	SL-2-2016	1	0	1
	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ	SLAS (Class I)	SL-1-2016	5	4	1**
	ප්‍රධාන ගණකාධිකාරී	SLAcS(Class I)	SL-1-2016	1	1	0
	ප්‍රධාන අභ්‍යන්තර විගණක	SLAcS(Class I)	SL-1-2016	1	0	1
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	SLAS(Class II or III)	SL-1-2016	10	9	1
	ගණකාධිකාරී	SLAcS(Class I)	SL-1-2016	1	0	1
	ගණකාධිකාරී	SLAcS(Class II or III)	SL-1-2016	9	8	1
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	SLITS(Class II or III)	SL-1-2016	1	1	0
	නීතිනිලධාරී	Dept	SL-1-2016	1	1	0
	පරිගණක මෘදුකාංග සංවර්ධක (කොන්ත්‍රාත්පදනම)	Dept		3	0	3
				36	**27**	**09**
කනිෂ්ඨ මට්ටම	පරිපාලන නිලධාරී	PMAS (Supra)	MN-7-2016	4	3	1**
	භාෂා පරිවර්තක සිංහල -ඉංග්‍රීසි - 01 සිංහල - දෙමළ - 01	TS	MN-6-2016	2	1	1
	තොරතුරු හාසන්නිවේදන තාක්ෂණනිලධාරී	SLICTS	MN-6-2016	5	4	1
				11	**08**	**03**
ද්විතීය මට්ටම	කාර්මික නිලධාරී	SLTS	MN-3-2016	1	0	1
	අයවැය සහකාර	RS	MN-4-2016	1	0	1
	විශ්‍රාම වැටුප් නිලධාරී	Dept.	MN-4-2016	186	173	13*
	සංවර්ධන නිලධාරී	DOS	MN-4-2016	598	579	19
	කළමනාකරණ සේවා නිලධාරී	MSO	MN-2-2016	190	151	39
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	SLICTS	MT-1-2016	5	4	1
	ලේඛණ සහකාර	Dept.	MN-1-2016	119	114	5*
	Help Desk Operator	Dept.		2	0	2
				1,102	**1021**	**81**
ප්‍රාථමික මට්ටම	බංගලා භාරකරු	Dept.	PL-1-2016	2	1	1
	අරක්කැමි / උද්‍යානකම්කරු	Dept.	PL-2-2016	4	2	2
	රියදුරු	DS	PL-3-2016	12	11	1
	විදුලි කාර්මික	Dept.	PL-3-2016	1	0	1
	කාර්යාල කාර්ය සහායක	OES	PL-1-2016	78	62	16
				97	**76**	**21**
එකතුව				**1246**	**1132**	**114**

*විශ්‍රාම වැටුප් නිලධාරීන් සහ ලේඛන සහකාර නිලධාරීන් නැවත බඳවා ගැනීම සිදු නොකරයි.
** පූර්ණ කාලීන වැඩ බැලීම සඳහා පත් කර ඇත.

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
3. අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්) කාර්යාලය
4. පාලන අංශය
5. විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය
6. මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය
7. සත්කාර පියස
8. ප්‍රතිපත්ති හා විමර්ශන අංශය
9. සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය
10. විදේශ විශ්‍රාම වැටුප් අංශය
11. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය
12. ගෙවීම් අංශය
13. මාසික ගෙවීම් අංශය
14. පාරිතෝෂික ගෙවීම් අංශය
15. විෂමතා අංශය
16. වැන්දඹු අනත්දරු දායක මුදල් කළමනාකරණ අංශය
17. සැපයුම් අංශය
18. වැඩිපුර ගෙවීම් අයකිරීම් අංශය
19. රාජ්‍යසේවා අර්ථසාධක අරමුදල
20. නීති අංශය
21. අභ්‍යන්තර විගණන අංශය
22. තොරතුරු තාක්ෂණ අංශය
23. මාධ්‍ය අංශය
24. තැපැල් අංශය
25. 1970 - ක්ෂණික දුරකථන ඇමතුම් අංශය

02.
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශ්‍රාම වැටුප් ගෙවීම් කාර්යක්ෂම කිරීම

2025 වර්ෂය තුළ විශ්‍රාමිකයින් 27,752 සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සිදු කර ඇත. එසේම මුද්‍රණය කර ගැනීම සඳහා ඉල්ලීම් කර තිබූ අස්ථානගත විශ්‍රාමික හැඳුනුම්පත් මුද්‍රණය කර විශ්‍රාමිකයින්ට නිදහස් කිරීම සිදු කල අතර මධ්‍යගත ක්‍රමවේදය යටතේ විශ්‍රාම ගොස් සිටින විමධ්‍යගත අංශය වෙත තොරතුරු ඉදිරිපත් වී ඇති විශ්‍රාමිකයින්ගේ හැඳුනුම්පත් මුද්‍රණය කර අවසන් කර ඇත.

පාරිතෝෂික ගෙවීම් කාර්යක්ෂම කිරීම

2025 වර්ෂයේ ප්‍රථම විශ්‍රාම වැටුප් සක්‍රීය කර ඇති සියළුම විශ්‍රාමිකයින් සඳහා පාරිතෝෂික ගෙවීම් සිදු කර ඇති අතර මේ වන විට විශ්‍රාම වැටුප් ආරම්භ කළ මාසයේ දීම පාරිතෝෂික ගෙවීම් සිදු කරනු ලැබේ. මේ වන විට ස්ලිප් ක්‍රමය (Slip method) හරහා ගෙවීම් කිරීම ආරම්භ කොට ඇති බැවින් විශ්‍රාමිකයින්ට ප්‍රමාදයකින් තොරව තම ප්‍රතිලාභ අත් කර ගැනීමට පහසුකම් සලසා ඇත. ඒ අනුව 2025 වර්ෂයේ විශ්‍රාමිකයින් 33,835 ක් සඳහා පාරිතෝෂික ගෙවීම් සිදු කර ඇත.

අයවැය යෝජනා අනුව විශ්‍රාම වැටුප් ගැලපීම

2025 අයවැය යෝජනා අනුව සිදු කරන ලද වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප් ගැලපීම සඳහා කටයුතු කල යුතු ආකාරය පිළිබඳව උපදෙස් හා විධිවිධාන ඇතුළත් කරමින් 2025.05.29 දිනැතිව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2025 හා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි 01/2025 නිකුත් කිරීම.

අයවැය යෝජනා අනුව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම

2025 අයවැය යෝජනා සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි 2018.01.01, 2019.01.01 හා 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් කරමින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2025 නිකුත් කිරීම.

වැන්දඹු අනත්දරු ගෙවීම් කාර්යක්ෂම කිරීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2025 අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි නව දායකත්වය ලබා ගැනීමේ ක්‍රමවේදය සහ නැවත ලියාපදිංචි වීමේ ක්‍රමවේදය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. එමඟින් දායකත්වයෙන් පසු ප්‍රතිලාභ හිමි ගැන්වීමට අපේක්ෂිත අයවළුන්ගේ තොරතුරු ද පද්ධතියට ඇතුළත් කිරීම මත ඉදිරියේදී ප්‍රමාදයන්ගෙන් තොරව ප්‍රතිලාභ හිමිගැන්වීම අපේක්ෂා කෙරේ.

ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් කාර්යක්ෂම කිරීම

විශ්‍රාම වැටුප් ලබන දායකයින්ගේ ඇවෑමෙන් පසු ආබාධිත අනත්දරුවන්ට ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් තීරණයන්ට අදාල වෛද්‍ය මණ්ඩලයට යොමු කිරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ගෙන් සිදු කර, අනුමත වෛද්‍ය මණ්ඩල තීරණ සමඟ DS PORTAL පද්ධතිය හරහා තොරතුරු ඇතුළත් කිරීමේ පහසුකම හදුන්වා දීම.

විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම

පෙර වර්ෂවලට සාපේක්ෂව 2025 වර්ෂයේදී ජීවිත සහතික ලබා දීමේ ප්‍රවණතාවය වැඩිදියුණු වීම විදේශ විශ්‍රාම වැටුප් ගෙවීමේදී අත්පත් කරගත් සුවිශේෂී ජයග්‍රහණයකි.

සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් ගෙවීම

2025.01.01 දින සිට 2025.03.31 දින දක්වා විශ්‍රාම යන හමුදා සාමාජිකයින්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ 3/2016 ට අනුව ගෙවීම් කරන ලද සේවා විශ්‍රාම වැටුප්, 2025.07.01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 5/2025 අනුව සංශෝධනය කිරීම.
2025.04.01 දින විශ්‍රාම යන හමුදා සාමාජිකයින්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ 5/2025 ට අනුව 2025 වර්ෂයට අදාළ වැටුපට පාරිතෝෂික ගෙවීම සහ 2027 වර්ෂයට අදාළ වැටුපට සේවා විශ්‍රාම වැටුප් ගෙවීම.
වන්දි වැටුප් නොලබන හමුදා සාමාජිකයින්ට දුබලතා විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම නව කාණ්ඩ අංකයක් යටතේ (77) ආරම්භ කිරීම.

නව ඩිජිටල් තොරතුරු තාක්ෂණ පද්ධතීන් පහක් ජනගත කිරීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව "විශ්‍රාම කළමනාකරණ දත්ත පද්ධතිය"((Pensions Management System) තවදුරටත් පුළුල් කරමින් පහත පරිදි නව ඩිජිටල් තාක්ෂණික පද්ධති 5ක් එළිදැක්වීම 2025.01.17 දින රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ආචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් හා අමාත්‍යාංශ ලේකම් එස්. ආලෝකබණ්ඩාර මහතාගේ සහභාගීත්වයෙන් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේදී සිදු කිරීම.

- වැඩිදියුණු කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය
- විශ්‍රාමික මරණ වාර්තා කිරීමේ තොරතුරු පද්ධතිය
- විශ්‍රාමිකයින්ගේ දුම්රිය වොරන්ට් බලපත්‍ර මාර්ගගතව වෙන්කර ගැනීම හා දුම්රිය බලපත්‍ර ලබා ගැනීම සඳහා වන තොරතුරු පද්ධතිය
- වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි ලියාපදිංචි කිරීමේ නව තොරතුරු පද්ධතිය
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි කිරීමේ නව ප්‍රතිනිර්මාණය කරන ලද තොරතුරු පද්ධතිය

මෙම පද්ධතීන් හරහා දෙපාර්තමේන්තුවේ පැවති ක්‍රමවේදයන් ප්‍රතිනිර්මාණය (Process Re-Engineering) කර ඇති අතර, විශ්‍රාමිකයින් හා රාජ්‍ය සේවකයින් වෙත සපයනු ලබන දෙපාර්තමේන්තු සේවා තවදුරටත් පුළුල් කිරීමටත්, අභ්‍යන්තර ක්‍රියාවලීන් සරල කිරීමටත් මෙමගින් හැකියාව ලැබේ.





නව ඩිජිටල් තොරතුරු තාක්ෂණ පද්ධතීන් ජනගත කිරීමේ වැඩසටහනේ අවස්ථා

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ට අනුරූපීව දත්ත පද්ධතීන් සංශෝධනය කිරීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ට අනුරූපීව 2025.01.01 දිනට පසුව විශ්‍රාම ගන්වනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සකස් කිරීමට හැකි වන පරිදි ප්‍රථම විශ්‍රාම වැටුප් සක්‍රීය කරන පද්ධතීන් සංශෝධනය කරන ලද අතර, විශ්‍රාම වැටුප් එක් වැටුපක් යටතේ හා විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය වෙනත් වැටුප් පරිමාණයක් යටතේ ගණන් බැලීම ප්‍රථම වතාවට මෙම වැටුප් චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ සිදුවිය. එයට සරිලන ප්‍රායෝගික තාක්ෂණික විසඳුමක් වශයෙන් අන්තර්කාලීන තොරතුරු පද්ධතියක් (Interim Solution 2025), විශ්‍රාම වැටුප 2027 වර්ෂයට හිමිවිය යුතු වැටුපට අනුරූප වන සේ ගැලපීම සඳහා පූර්ණ ස්වයංක්‍රීය ගණනය කිරීම් සහිතව පද්ධතියක් හදුන්වා දෙන ලදී.

විශ්‍රාම වැටුප් සංශෝධන තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම

2025 අයවැය යෝජනා අනුව 2018.01.01 දිනට පෙර විශ්‍රාම ගන්වන ලද සියළුම විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් 2025.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කිරීම අවශ්‍ය විය. මේ සඳහා නැවත දත්ත ඇතුළත් කිරීමකින් තොරව, ප්‍රථම වරට පූර්ණ ස්වයංක්‍රීයව ගණනය කිරීම් සහිත විශ්‍රාම වැටුප් සංශෝධන තොරතුරු පද්ධතියක් සංවර්ධනය කර මාර්ගගතව මුදාහරින ලදී. මෙහිදී එකිනෙකට වෙනස් වූ සියළුම විශ්‍රාම වැටුප් ගණනයන්, වැටුප් පරිමාණයන් හා විවිධ සේවා තත්ත්වයන් සියල්ලක්ම විශ්ලේෂණය කර සංශෝධිත විශ්‍රාම වැටුප ස්වයංක්‍රීයව ගණනය කිරීම සිදු කරනු ලැබේ. එය ගොනු සමඟ පරීක්ෂා කර බැලීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කිරීම සඳහා මාර්ගගතව පහසුකම් සලසා ඇත.

iPMS සංකල්පය ක්‍රියාත්මක කිරීම

iPMS (integrated Pension Management System) සංකල්පය යටතේ බාහිර රාජ්‍ය ආයතන සමඟ ඩිජිටල් ඒකාබද්ධීකරණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) සමඟ සහයෝගී ව්‍යාපෘතියක් ලෙස ප්‍රතිලාභී දත්ත සත්‍යාපනය කිරීම සඳහා වැන්දඹු අනත්දරු ලියාපදිංචි දත්ත මූලය පාදක කර ගනිමින් API සබඳතා මඟින් කාර්යයන් සරල කිරීමේ සුහුරු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත.

අභ්‍යන්තර කටයුතු ඒකකයේ මෙහෙයුම් සඳහා නිල කාර්යාලයක් ස්ථාපිත කිරීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර කටයුතු ඒකකයේ මෙහෙයුම් සඳහා නිල කාර්යාලයක් 2025.11.11 දින ස්ථාපිත කරන ලදී. මෙම කාර්යාලය ජනාධිපති අතිරේක ලේකම් චන්දිමා වික්‍රමසිංහ මහත්මිය හා අධ්‍යක්ෂ ජනරාල් චාමින්ද හෙට්ටිආරච්චි මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත විය.

අභ්‍යන්තර ඒකකයේ ප්‍රධාන අරමුණ වන්නේ දෙපාර්තමේන්තු සේවාවන්හි විනිවිදභාවය හා නිරවද්‍යතාවය සහතික කරමින් දූෂණ, වංචා සහ අක්‍රමිකතා වැළැක්වීමයි. එවැනි සිද්ධීන් සම්බන්ධයෙන් ලිඛිතව, දුරකථන, ඊමේල්, QR කේතය හෝ පැමිණිලි පෙට්ටිය මඟින් පැමිණිලි ඉදිරිපත් කළ හැකි අතර, තොරතුරු සපයන්නන්ගේ රහස්‍යභාවය සම්පූර්ණයෙන් ආරක්ෂා කෙරේ.





අභ්‍යන්තර කටයුතු ඒකකයේ මෙහෙයුම් සඳහා නිල කාර්යාලය ස්ථාපිත කිරීමේ අවස්ථා

පුහුණු වැඩසටහන් පැවැත්වීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය හා සම්බන්ධව කටයුතු කරන විවිධ රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන්සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුහුණු වැඩසටහන් සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇති අතර මේ වන විට අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 27 ක්මඟින් 6,500 කට අධික නිලධාරීන් පිරිසක් සඳහා පුහුණුවීම් සිදු කර ඇති අතර විදේශ පුහුණු වැඩසටහන් 04 ක් සඳහා මාණ්ඩලික නිලධාරීන් 07 දෙනෙකු සහභාගී වී ඇත.

තවද බාහිර ආයතන මඟින් පවත්වනු ලැබූ විෂය සමගාමී පුහුණු වැඩසටහන් 29 ක් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 50 දෙනෙකු සහභාගී වී ඇති අතර විවිධ රාජ්‍ය ආයතන මඟින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 36ක් සඳහා සම්පත්දායකත්වය ලබාදීම සිදු කර ඇත. එමෙන්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවන් සඳහා පැමිණි ත්‍රීකුණාමලය නාවික හා සාගරික විද්‍යා පීඨයේ නිලධාරීන් කණ්ඩායම් සඳහා සාමාන්‍ය විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය, ත්‍රිවිධ හමුදාවන්ට අයත් නිලධරයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිගැන්වීම, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.





නාවික හා සාගරික විද්‍යා පීඨයේ නිලධාරීන් කණ්ඩායම් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්හි අවස්ථා

සුපිළිපන් රාජ්‍ය සේවයක් වෙනුවෙන් පෙළගැසීම

රාජ්‍ය සේවය අල්ලසෙන් හා දූෂණයෙන් තොර සුපිළිපන් සේවයක් කිරීමේ උදාරතර අරමුණ අනුව යමින් දෙපාර්තමේන්තු නිලධාරීන් අතර ඒ පිළිබඳව කතිකාවතක් නිර්මාණය කිරීමේ වැඩසටහනක් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) ඩයනා කොඩිතුවක්කු මෙනවියගේ හා දූෂණ නිවාරණ නිලධාරි ෂම්මි ශ්‍රීලාල් මහතාගේ සම්පත්දායකත්වයෙන් යුතුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිශ්‍රයේදී පැවැත්විණි.




සුපිළිපන් රාජ්‍ය සේවයක් වෙනුවෙන් කතිකාවතක් නිර්මාණය කිරීමේ වැඩසටහනේ අවස්ථා

ජාතික විශ්‍රාමික දිනය සැමරීම

ජාතික විශ්‍රාමික දිනය 2025 ඔක්තෝබර් 08 දින කැලණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේදී අභිමානයෙන් සමරනු ලැබීය. උත්සවය ගරු අමාත්‍ය ආචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

'සවිමත්, සුවපත්, දිරිමත් දිවියකී' යන තේමාව යටතේ වෛද්‍ය කඳවුරු, උපදේශන සහ රසවින්දනාත්මක වැඩසටහන් සංවිධානය කෙරිණි. විශ්‍රාමිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා වැටුප් ප්‍රතිලාභ වැඩිදියුණු කිරීම සඳහා රජය කැපවී සිටින බවද මෙහිදී අවධාරණය කෙරිණි.




ජාතික විශ්‍රාමික දිනය සැමරීමේ අවස්ථා

2025 වර්ෂයේ නිකුත් කර ඇති චක්‍රලේඛ

	නිකුත් කළ දිනය	චක්‍රලේඛ අංකය	කාරණය
01	2025-01-20	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025	වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ රාජ්‍ය නිලධාරීන් ලියාපදිංචි කිරීම සහ නව මාර්ගගත තොරතුරු පද්ධතියක් හරහා ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය කිරීම.
02	2025-05-29	01/2025	2025 අයවැය යෝජනාවේ වැටුප් සංශෝධනයට අනුකූලව විශ්‍රාම වැටුප් සැකසීම
03	2025-07-01	02/2025	2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි II වන උප ලේඛනයේ 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 යන දිනවල හිමිවන වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම.
04	2025-09-16	Pen/Pol/06/25-2024	විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2024 (සංශෝධන I)
05	2025-11-01	03/2025	2026 වසරේ විශ්‍රාම වැටුප් ගෙවීම
06	2025-11-14	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025(I)	2025 අයවැය යෝජනා අනුව 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනයන් සඳහා හිමි වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම.
07	2025-11-17	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025(I)	රාජ්‍ය නිලධරයන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය, නව මාර්ගගත තොරතුරු පද්ධතියක් ඔස්සේ සිදු කිරීම
08	2025-11-22	02/2025 (සංශෝධන I)	2025 අයවැය යෝජනා අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ විශ්‍රාමික නිලධරයන්ටගේ විශ්‍රාම වැටුප 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කිරීම.
09	2025-12-31	01/2025 (සංශෝධන I)	2025 අයවැය යෝජනා අනුව වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප් ගැළපීම

2025 වර්ෂයේ නිකුත් කර ඇති උපදෙස් ලිපි

	නිකුත් කළ දිනය	උපදෙස් ලිපි අංකය	කාරණය
01	2025-05-29	01/2025	2025 අයවැය යෝජනා අනුව විශ්‍රාම වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප් ගැළපීම
02	2025-06-26	10/2024(සංශෝධන I)	විශ්‍රාමික ජීවිත සහතිකය - 2025
03	2025-07-23	02/2025	2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උප ලේඛනයේ II හි 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම
04	2025-09-16	10/2025 Interim	PD 03 අතුරු විසඳුම
05	2025-09-30	03/2025	විශ්‍රාමිකයින්ට රුපියල් 3000.00ක විශේෂ අන්තර්කාලීන මාසික දීමනාවක් ගෙවීම
06	2025-10-03	04/2025	2025 අයවැය යෝජනා අනුව සිදුකරන ලද වැටුප් සංශෝධනය පරිදි විශ්‍රාම වැටුප් ගැළපීමට අදාළ අන්තර්කාලීන ක්‍රමවේදය (Interim Solution) හඳුන්වාදීම
07	2025-10-16	Pen/Pol/06/20-2023	දුම්රිය ගමන් බලපත්‍ර තාවකාලිකව මාර්ගගත නොවන ක්‍රමවේදය ඔස්සේ නිකුත් කිරීම
08	2025-10-23	05/2025	2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උප ලේඛනයේ II හි 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම
09	2025-10-27	06/2025	2025.04.01 දින ද සේවයේ යෙදී සිට ඉන් පසු විශ්‍රාම ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් අයදුම්පත් (PD 03) මධ්‍යගතගත ක්‍රමවේදය ඔස්සේ මාර්ගගත නොවන ආකාරයට ඉදිරිපත් කිරීම
10	2025-11-04	විශ්‍රාම වැටුප් සංශෝධන ක්‍රමය (3 සහ 4 කාණ්ඩය)	විශ්‍රාම වැටුප් සංශෝධන ක්‍රමය (3 සහ 4 කාණ්ඩය)
11	2025-11-18	07/2025	2025.04.01 දිනෙන් පසුව සේවයෙන් විශ්‍රාම ගෙන 2025 අයවැය යෝජනා මඟින් ප්‍රකාශිත නව වැටුප් පරිමාණ අනුව විශ්‍රාම වැටුප් නොලබන විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය සංශෝධනය කිරීම
12	2025-12-19	08/2025	විශ්‍රාමික ජීවිත සහතිකය- 2026
13	2025-12-19	07/2025 (සංශෝධන I)	2025.04.01 දිනෙන් පසුව සේවයෙන් විශ්‍රාම ගෙන 2025 අයවැය යෝජනා මඟින් ප්‍රකාශිත නව වැටුප් පරිමාණ අනුව විශ්‍රාම වැටුප් නොලබන විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය සංශෝධනය කිරීම

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- **විශ්‍රාම වැටුප් ගෙවීම්**

- මාසිකව ගෙවීම් කරන ලද සිවිල්, හමුදා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සංඛ්‍යාව

මාසය	සිවිල්		වැ.අ.වි.වැ.		හමුදා		මුළු විශ්‍රාමිකයින් ගණන	මුළු මුදල (රු.)
	විශ්‍රාමිකයින් ගණන	මුදල (රු.)	විශ්‍රාමිකයින් ගණන	මුදල (රු.)	විශ්‍රාමිකයින් ගණන	මුදල (රු.)		
ජනවාරි	397208	18,017,874,426.57	189228	6,206,418,651.56	138967	7,265,487,285.47	725403	31,489,780,363.60
පෙබරවාරි	398056	18,325,047,917.19	189326	6,258,275,776.92	139710	7,379,212,539.39	727092	31,962,536,233.50
මාර්තු	398888	18,027,555,716.10	189498	6,291,925,508.50	140575	7,347,317,950.35	728961	31,666,799,174.95
අප්‍රේල්	399556	18,623,435,148.70	189598	6,272,835,964.40	141052	7,637,349,349.28	730206	32,533,620,462.38
මැයි	399266	18,157,991,899.07	189107	6,123,407,886.90	141218	7,433,166,363.56	729591	31,714,566,149.53
ජූනි	399386	18,378,267,892.26	189007	6,282,555,841.79	141443	7,513,044,556.32	729836	32,173,868,290.37
ජූලි	398109	19,113,000,647.76	187908	6,521,275,741.23	141078	7,708,495,671.87	727095	33,342,772,060.86
අගෝස්තු	399438	19,602,576,216.32	188870	6,911,178,749.37	142126	7,964,092,197.01	730434	34,477,847,162.70
සැප්තැම්බර්	400267	20,271,365,898.00	189199	7,324,751,087.41	142890	8,062,723,998.61	732356	35,658,840,984.02
ඔක්තොම්බර්	401915	19,965,546,811.68	189466	6,754,002,488.23	143728	8,012,161,175.29	735109	34,731,710,475.20
නොවැම්බර්	402717	19,946,267,127.13	189726	6,824,942,823.70	144272	8,000,524,585.11	736715	34,771,734,535.94
දෙසැම්බර්	405618	21,033,547,639.90	190208	7,067,154,977.29	145055	8,425,706,928.27	740881	36,526,409,545.46
එකතුව		**229,462,477,340.68**		**78,838,725,497.30**		**92,749,282,600.53**		**401,050,485,438.51**

- වාර්ෂික විශ්‍රාම වැටුප් වියදම

වර්ෂය	වියදම (රු,000)
2021	269,827,125
2022	309,066,783
2023	372,364,441
2024	395,720,004
2025	444,497,543

- සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

මාසය	සිවිල්		වැ.අ.වි.වැ.		හමුදා		මුළු විශ්‍රාමිකයින් ගණන	මුළු මුදල (රු.)
	විශ්‍රාමිකයින් ගණන	මුදල (රු.)	විශ්‍රාමිකයින් ගණන	මුදල (රු.)	විශ්‍රාමිකයින් ගණන	මුදල (රු.)		
ජනවාරි	1007	264,306,886.71	421	138,055,418.16	439	77,312,060.84	1867	479,674,365.71
පෙබරවාරි	1928	593,424,683.70	749	227,792,844.39	836	168,980,430.99	3513	990,197,959.08
මාර්තු	1921	238,220,527.60	899	268,636,970.25	969	86,684,658.16	3789	593,542,156.01
අප්‍රේල්	1653	453,861,162.90	802	241,407,909.83	597	147,501,133.98	3052	842,770,206.71
මැයි	753	226,196,156.26	180	84,201,563.94	306	82,262,754.18	1239	392,660,474.38
ජූනි	1359	504,779,427.55	769	248,042,629.79	405	125,242,723.59	2533	878,064,780.93
ජූලි	1418	537,173,490.92	992	298,054,573.81	606	161,433,409.62	3016	996,661,474.35
අගෝස්තු	1752	581,291,382.27	1158	368,664,768.70	931	244,783,120.02	3841	1,194,739,270.99
සැප්තැම්බර්	1653	616,194,028.86	803	269,929,743.22	754	231,532,250.72	3210	1,117,656,022.80
ඔක්තොම්බර්	2326	895,074,767.69	615	223,444,559,.13	826	223,517,346.38	3767	1,342,036,673.20
නොවැම්බර්	1830	728,754,314.15	940	299,059,778.08	586	162,237,461.38	3356	1,190,051,553.61
දෙසැම්බර්	3899	1,468,524,336.68	1093	339,656,863.97	774	211,404,654.10	5766	2,019,585,854.75
එකතුව	**21499**	**7,107,801,165.29**	**9421**	**3,006,947,623.27**	**8029**	**1,922,892,003.96**	**38949**	**12,037,640,792.52**

දිස්ත්‍රික් පදනමින් විශ්‍රාමිකයින් සංඛ්‍යාව සහ වියදම -2025 දෙසැම්බර්

දිස්ත්‍රික්කය	විශ්‍රාමිකයින් ගණන	මුදල (රු)	අඩු කිරීම්	මුදල (රු)
ගම්පහ	92137	4,400,524,254.95	70,369,088.34	4,330,155,166.61
කොළඹ	90542	4,569,022,617.29	67,507,694.44	4,501,514,922.85
කුරුණෑගල	73283	3,720,753,786.40	62,505,614.08	3,658,248,172.32
මහනුවර	64609	3,227,411,167.42	56,691,845.50	3,170,719,321.92
කළුතර	47324	2,264,899,504.93	42,775,782.09	2,222,123,722.84
අනුරාධපුරය	43716	2,167,904,170.77	57,757,571.51	2,110,146,599.26
ගාල්ල	41632	2,029,407,007.66	38,326,995.17	1,991,080,012.49
කෑගල්ල	35918	1,793,262,065.88	34,050,257.62	1,759,211,808.26
බදුල්ල	31210	1,535,043,515.09	35,145,758.50	1,499,897,756.59
මාතර	30344	1,499,587,574.60	27,762,917.10	1,471,824,657.50
රත්නපුර	25708	1,276,343,546.43	25,496,064.59	1,250,847,481.84
මාතලේ	20215	999,434,757.23	18,552,514.64	980,882,242.59
හම්බන්තොට	19160	944,121,296.11	17,613,125.26	926,508,170.85
පුත්තලම	16785	806,600,487.37	12,830,633.11	793,769,854.26
අම්පාර	16427	863,769,323.53	17,913,357.92	845,855,965.61
යාපනය	15502	752,495,438.52	8,388,228.68	744,107,209.84
මොණරාගල	14072	676,058,339.95	12,174,027.45	663,884,312.50
පොළොන්නරුව	13489	659,388,987.70	14,050,629.38	645,338,358.32
නුවරඑළිය	12807	618,909,459.21	10,435,671.06	608,473,788.15
මඩකලපුව	9632	485,569,240.48	8,690,672.59	476,878,567.89
ත්‍රිකුණාමලය	9787	492,095,405.26	7,210,850.96	484,884,554.30
වව්නියාව	3418	171,031,857.71	1,812,348.92	169,219,508.79
මන්නාරම	1850	87,622,967.15	3,719,399.01	83,903,568.14
කිලිනොච්චි	1383	63,988,371.39	733,888.70	63,254,482.69
මුලතිව්	1382	63,799,526.96	364,537.09	63,434,989.87
එකතුව	**740881**	**36,526,409,545.46**	**656,182,445.13**	**35,870,227,100.33**

- පාරිතෝෂික ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්)

මාසය	විශ්‍රාමිකයින් සංඛ්‍යාව	මුදල (රු)*
ජනවාරි	2,378	2,809,832,208.50
පෙබරවාරි	1,116	1,264,916,271.97
මාර්තු	4,685	5,558,795,406.43
අප්‍රේල්	677	694,894,849.16
මැයි	2,944	2,937,466,281.47
ජූනි	2,990	3,586,586,933.26
ජූලි	2,414	2,657,480,232.64
අගෝස්තු	2,874	4,461,166,455.53
සැප්තැම්බර්	2,947	4,209,654,495.72
ඔක්තෝබර්	2,679	4,240,434,469.53
නොවැම්බර්	3,337	5,082,660,220.78
දෙසැම්බර්	4,794	7,295,506,980.28
එකතුව	**33,835**	**44,799,394,805.27**

*මුදා හරින ලද ප්‍රතිපාදන

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- අග්‍රහාර රක්ෂණ අරමුදලට අයකිරීම් (ජනවාරි-දෙසැම්බර්)

මාසය	මුළු විශ්‍රාමිකයින් ගණන	මුළු මුදල (රු)
ජනවාරි	164,399	34,126,800.00
පෙබරවාරි	166,117	35,407,600.00
මාර්තු	167,837	35,440,200.00
අප්‍රේල්	171,247	36,779,600.00
මැයි	171,825	35,464,800.00
ජුනි	172,988	36,564,400.00
ජුලි	173,907	36,738,400.00
අගෝස්තු	175,636	37,098,000.00
සැප්තැම්බර්	177,173	37,171,400.00
ඔක්තෝබර්	179,369	38,455,400.00
නොවැම්බර්	180,913	38,508,000.00
දෙසැම්බර්	184,667	41,414,400.00
එකතුව	**2,086,078**	**443,169,000.00**

- රු.5000ක මාසික දීමනාව ගෙවන ලද විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි-දෙසැම්බර්)

මාසය	විශ්‍රාමිකයින් ගණන	මුළු මුදල (රු)
ජනවාරි	624,871	3,119,861,059.75
පෙබරවාරි	626,501	3,127,986,789.41
මාර්තු	628,241	3,136,618,680.73
අප්‍රේල්	629,366	3,142,150,110.84
මැයි	628,777	3,139,195,729.13
ජුනි	629,272	3,141,686,777.18
ජුලි	627,991	3,135,281,285.17
අගෝස්තු	629,344	3,141,988,949.17
සැප්තැම්බර්	629,496	3,142,708,525.41
ඔක්තෝබර්	629631	3,143,362,667.88
නොවැම්බර්	629077	3,140,518,025.43
දෙසැම්බර්	627307	3,131,626,848.02
එකතුව	**7,539,874**	**37,642,985,448.12**

- රු.3000 ක මාසික දීමනාව ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)

වර්ෂය	විශ්‍රාමිකයින් සංඛ්‍යාව	මුදල (රු.)
ජනවාරි	685,359	2,039,693,527.65
පෙබරවාරි	686,983	2,044,641,158.09
මාර්තු	688,785	2,050,109,288.76
අප්‍රේල්	689,960	2,053,769,992.23
මැයි	689,447	2,052,396,364.02
ජුනි	689,654	2,053,282,715.44
ජූලි	686,578	2,044,270,335.95
අගෝස්තු	688,059	2,048,777,333.28
සැප්තැම්බර්	688,174	2,049,174,684.33
ඔක්තෝබර්	688,464	2,050,094,585.20
නොවැම්බර්	688,059	2,048,930,877.08
දෙසැම්බර්	686,182	2,043,371,378.18
එකතුව	**8,255,704**	**24,578,512,240.21**

- විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන (ජනවාරි- දෙසැම්බර්)

මාසය	සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.මිලියන)
ජනවාරි	1100	166.64
පෙබරවාරි	1055	153.84
මාර්තු	881	131.13
අප්‍රේල්	959	136.29
මැයි	619	108.76
ජුනි	1087	154.14
ජූලි	971	142.97
අගෝස්තු	1074	134.84
සැප්තැම්බර්	1036	119.31
ඔක්තෝබර්	897	123.63
නොවැම්බර්	795	106.54
දෙසැම්බර්	929	142.44
එකතුව	**11403**	**1620.53**

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- **වැන්දඹු හා අනත්දරුදායක මුදල් ආපසු ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්)**

මාසය	ගෙවූ සංඛ්‍යාව
ජනවාරි	186
පෙබරවාරි	283
මාර්තු	192
අප්‍රේල්	78
මැයි	55
ජුනි	302
ජුලි	357
අගෝස්තු	276
සැප්තැම්බර්	310
ඔක්තෝබර්	377
නොවැම්බර්	217
දෙසැම්බර්	267
එකතුව	**2900**

- **සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයින්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම් - 2025 දෙසැම්බර් දක්වා**

ආයතනය	සංඛ්‍යාව	2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා
		ගෙවූ මුදල (රු.මිලියන)
යුද්ධ හමුදා	30,564	43,796,943,703
නාවික හමුදා	1,367	1,690,829,980
ගුවන් හමුදා	455	513,555,506
පොලිස්	1,404	235,803,834
ස්ථාවර දීමනා ගෙවීම්	3,880	127,884,814
රු.5000 දීමනා ගෙවීම්	-	-
එකතුව	**37670**	**46,365,017,837**

*මුදා හරින ලද ප්‍රතිපාදන

- **වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම්**

මාසය	වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් නව ගෙවීම් සංඛ්‍යාව	මරණ පාරිතෝෂික ගෙවීම් සංඛ්‍යාව
ජනවාරි	349	94
පෙබරවාරි	675	189
මාර්තු	828	104
අප්‍රේල්	742	57
මැයි	149	132
ජුනි	730	88
ජුලි	912	167
අගෝස්තු	1104	23
සැප්තැම්බර්	746	106
ඔක්තෝබර්	562	129
නොවැම්බර්	894	98
දෙසැම්බර්	1027	94
එකතුව	**8718**	**1281**

- **සන්නද්ධ සේවා අංශයෙන් මධ්‍යම දත්ත පද්ධතියට එකතු කල විශ්‍රාම වැටුප් සහ සංශෝධන**

විශ්‍රාම වැටුප් වර්ගය	ගෙවූ සංඛ්‍යාව (යුද්ධ/ ගුවන්/නාවික)
සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් (අවු.10/12 ට අඩු)	42
හමුදා සංශෝධන	1408
උරුමකරු	45
ප්‍රතිශෝධන (අවුරුදු 55 සම්පූර්ණ)	1201
මරණ පාරිතෝෂික	279
සේවා පාරිතෝෂික	1369
යැපෙන්නන්ගේ දීමනා	457
දුබලතා විශ්‍රාම වැටුප	15
ස්ථාවර දීමනා	729
විශේෂ වන්දි	61
නැවත සේවා	09
එකතුව	**5615**

- **විශ්‍රාම වැටුප් ගෙවූ විදෙස්ගත විශ්‍රාමිකයින් සංඛ්‍යාව**

මාසය	විශ්‍රාමිකයින් ගණන	ගෙවූ මුදල (රු)
ජනවාරි	8269	301,462,348.20
පෙබරවාරි	8358	325,056,247.14
මාර්තු	8439	305,976,736.81
අප්‍රේල්	8561	317,350,067.10
මැයි	8679	337,124,217.79
ජුනි	8767	309,434,576.88
ජුලි	7973	307,383,848.63
අගෝස්තු	8082	324,961,941.72
සැප්තැම්බර්	8202	336,345,834.15
ඔක්තෝබර්	8303	328,096,263.42
නොවැම්බර්	8398	323,837,903.61
දෙසැම්බර්	8549	357,364,875.47
එකතුව		**3,874,394,860.92**

- **වැටුප් හා අනෙකුත් පරිපාලන වියදම්**

වර්ෂය	වටිනාකම (රු. 000)
2021	38,591,300
2022	41,003,000
2023	43,968,727
2024	47,714,819
2025	50,984,836

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් සහ ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)

මාසය	ලැබීම් (රු)	ගෙවීම් (රු)
ජනවාරි	55,776,715.43	41,605,741.46
පෙබරවාරි	37,190,548.45	48,209,109.59
මාර්තු	51,734,349.97	62,197,251.90
අප්‍රේල්	35,305,363.80	45,639,813.15
මැයි	40,251,017.88	54,635,824.26
ජුනි	68,797,202.41	66,712,312.40
ජුලි	75,009,107.90	53,670,573.15
අගෝස්තු	43,872,861.87	91,167,833.22
සැප්තැම්බර්	70,365,342.68	41,766,583.17
ඔක්තෝබර්	67,608,521.20	57,445,573.48
නොවැම්බර්	77,441,775.63	82,263,895.62
දෙසැම්බර්	91,429,333.27	109,126,921.36
එකතුව	**714,782,140.49**	**754,441,432.76**

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක්වූ සහ ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

මාසය	අලුතින් එක් වූ සාමාජික සංඛ්‍යාව	ඉවත් වූ සාමාජික සංඛ්‍යාව
ජනවාරි	509	531
පෙබරවාරි	750	595
මාර්තු	325	532
අප්‍රේල්	18	369
මැයි	40	419
ජුනි	70	491
ජුලි	156	552
අගෝස්තු	127	569
සැප්තැම්බර්	183	536
ඔක්තෝබර්	136	526
නොවැම්බර්	117	443
දෙසැම්බර්	170	503
එකතුව	**2601**	**6066**

- අයකරන ලද වැන්දඹු/වැන්දඹු පුරුෂ දායක මුදල් ප්‍රමාණය (ජනවාරි - දෙසැම්බර්)

විස්තරය	එකතු කරන ලද ආදායම (රු.)
මධ්‍යම රජය	32,960,428,796.34
පළාත් සභා	22,509,643,434.78
ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල	674,729,430.15
එකතුව	**56,144,801,661.27**

- **රා.ප.ව 14/2022 යටතේ දේශීය සහ විදේශ නිවාඩු ලබා ගන්නා ලද නිලධාරීන්ගෙන් අය කරගනු ලැබූ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ප්‍රමාණය**

මාසය	මුදල (රු)
ජනවාරි	26,123,518.73
පෙබරවාරි	19,297,698.86
මාර්තු	20,633,325.82
අප්‍රේල්	23,484,720.10
මැයි	13,660,738.91
ජුනි	26,498,513.99
ජුලි	22,303,687.40
අගෝස්තු	22,698,639.35
සැප්තැම්බර්	23,899,737.61
ඔක්තෝබර්	18,589,114.61
නොවැම්බර්	29,411.700.13
දෙසැම්බර්	19,419,711.43
එකතුව	**266,021,106.94**

- **රජයට ආදායම් උපයාදීම**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් දැනට කුලී පදනම මත ලබාදී ඇති ගොඩනැගිලි සඳහා ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා ගොඩනැගිලි කුලිය ලෙස රු.30,169,692.00 මුදලක් සහ නිවාඩු නිකේතන මගින් රු.8,025,050.00 මුදලක් රජයේ ආදායම් වශයෙන් උපයාදී ඇත.

- ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර - නීති අංශය

ගොණු හා ලිපි වර්ගය	ප්‍රමාණය	නිරීක්ෂණ ලබා දී ඇති ප්‍රමාණය	උපදේශණ සඳහා සහභාගි වූ ප්‍රමාණය	අවසන් කිරීමට ඇති ප්‍රමාණය
මානව හිමිකම් පැමිණිලි	163	163	-	-
මානව හිමිකම් සිතාසි	52	52	52	-
ඔම්බුඩිස්මන් පැමිණිලි	161	161	01	-
ශ්‍රේෂ්ඨාධිකරණ නඩු	06	06	06	තීන්දු 3 ක් ලැබී ඇත
අභියාචනාධිකරණ නඩු	09	09	09	තීන්දු ලැබී නැත
පළාත් බද මහාධිකරණ /දිසා අධිකරණ/මහේස්ත්‍රාත් අධිකරණ නඩු	06	06	01	තීන්දු ලැබී නැත
නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් සඳහා ගොනු	05	05	-	-
වෙනත් අංශ වලින් නිරීක්ෂණ සඳහා ලැබෙන ගොනු	106	87	-	-
එකතුව	**508**	**489**	**69**	

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- 2025 වර්ෂයේ ඉටුකර ඇති කාර්යන්හි ප්‍රගතිය - ප්‍රතිපත්ති අංශය

අනු අංක	කාර්යය	අවසන් කර ඇති ඉල්ලීම් ප්‍රමාණය/ ඉදිරිපත් කර ඇති වාර්තා ප්‍රමාණය
01	අනියම්, ආදේශක, තාවකාලික,කොන්ත්‍රාත්, සහන, උපාධිධාරී අභ්‍යාසලාභී, පුහුණු, ත්‍රිවිධ හමුදා සේවා කාල විශ්‍රාම වැටුප ගණනයට අදාළ කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීම	566
02	පාර්ලිමේන්තු කාරක සභා වෙත නිරීක්ෂණ/නිර්දේශ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම	
	i) මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වූ පෙත්සම්වලට අදාළව නිර්දේශ වාර්තා යොමු කිරීම	20
	ii) පාර්ලිමේන්තු වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා ලබා දීමට නිර්දේශිත පිළිතුරු සකස් කර ඉදිරිපත් කිරීම	7
	iii) අමාත්‍යාශයීය උපදේශක කාරක සභා වෙත ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා නිරීක්ෂණ/ නිර්දේශ ඇතුළත් වාර්තා සකස් කර යොමු කිරීම	10
03	ආංශික අධීක්ෂණ කාරක සභා විසින් යොමු කරන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අදාළ නිර්දේශ සකස් කර ඉදිරිපත් කිරීම	0
04	විශ්‍රාමිකයින්ගේ ගැටළු සම්බන්ධයෙන් විශ්‍රාමික සංගම් සමඟ සාකච්ඡා පැවැත්වීම	3
05	අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම	3
06	විශ්‍රාම වැටුප් චක්‍රලේඛ නිකුත් කිරීම හා උපදෙස් ලිපි නිකුත් කිරීම	16
07	පුද්ගලයින් වෙනත් ආයතන සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ වෙතින් යොමු කරන ගැටළු සඳහා ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම	224

- අභ්‍යන්තර විගණන පරීක්ෂණ පැවැත්වීම

විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතියේ පවතින ගැටළු සහ විශ්‍රාම වැටුප් වංචා හා අක්‍රමිකතා අවම කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් 2025 වසර තුළ දීඳ විගණන පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක විගණන පරීක්ෂණ පැවැත්වීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36 ක විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධති පරීක්ෂාව, ලක්ෂ 15 ට වැඩි විශ්‍රාම වැටුප් ලිපිගොනු 422 ක් පරීක්ෂාව හා දෙපාර්තමේන්තු අභ්‍යන්තර අංශ විගණනය සහ සේවා අවශ්‍යතාවය මත විවිධ කරුණු සම්බන්ධයෙන් විගණන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය හා සුබසාධනය සඳහා ගනු ලැබූ පියවර

අතිශය කාර්යබහුල රාජකාරී පරිසරයෙන් මුදවා නිලධාරීන් හට මඳ අස්වැසිල්ලක් ලබාදීමේ අරමුණින් දෙපාර්තමේන්තු සුභ සාධක සංගමය මගින් සංවිධානය කරන ලද Dayout වැඩසටහන අවිස්සාවේල්ල ප්‍රදේශයේ හෝටල් පරිශයේදී පවත්වන ලදී.



භෞතික වැඩිදියුණු කිරීම්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයවාර්ෂිකව විශ්‍රාමිකයින් හා රාජ්‍ය නිලධාරීන් විශාල ප්‍රමාණයක් සඳහා නවාතැන් පහසුකම් සපයනු ලබන බැවින් එම පරිශ්‍රය තවදුරටත් සංවර්ධනය කර එහි ප්‍රතිලාභ විශ්‍රාමිකයින් වෙත ලබාදීමේ අරමුණින් එහි පවතින නිවාස කිහිපයක් අළුත්වැඩියා කිරීම.

අභියෝග

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත 2025 අප්‍රේල් මුල් සතියේ සයිබර් ප්‍රහාරයක් (Ransomware) එල්ල විය. සිද්ධිය වාර්තා වූ වහාම ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SL CERT) සමඟ එක්ව විමර්ශනයක් ආරම්භ කර පද්ධති යථා තත්ත්වයට පත් කරන ලදී.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මඟ


1. 1934 පෙබරවාරි 05 දින ප්‍රකාශයට පත් කර ඇති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා ඉන්පසුව එනම්, 2025 වර්ෂය දක්වා නිකුත් කර ඇති සියලුම ගැසට් නිවේදනවල විධිවිධාන ඇතුළත් කරමින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කිරීම.
2. කුලී පදනම මත ලබාදීමට ඇති දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි නියමිත කුලිය මත රාජ්‍ය ආයතන වෙත ලබාදීම.
3. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ මඟපෙන්වීම යටතේ දෙපාර්තමේන්තුව තුළ අල්ලස හා දූෂණයෙන් තොර සුපිළිපන් රාජ්‍ය සේවයක් බිහිකිරීමට අදාල ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
4. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් දෙපාර්තමේන්තුවට අදාල කැපකිරීම් ඉටු කිරීම සඳහා අදාල ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
5. "ඵලදායීතාව තුලින් පොහොසත් රටක්" රාජ්‍ය ප්‍රතිපත්තියට සමඟාමීව ජාතික ඵලදායීතාව සම්මාන තරගාවලිය- 2025/26 පැවැත්වීම.
6. දෙපාර්තමේන්තුවේ නිතර විවේචනයට ලක්වන ක්ෂේත්‍රයක් වන දුරකථන ඇමතුම්වලට ප්‍රතිචාර නොදැක්වීමේ ගැටළුවට සාධනීය පිළිතුරක් වශයෙන් බාහිර පාර්ශවයන්ගේ දුරකතන ඇමතුම්වලට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීම.
7. Clean SriLanka රාජ්‍ය ප්‍රතිපත්තියට සමඟාමීව පාරිසරික, සාමාජීය හා ආචාර ධර්මීය වශයෙන් වන මූලික වෙනස්කම් දෙපාර්තමේන්තුව ආශ්‍රිතව සිදු කිරීම.

චාමින්ද හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත - කොළඹ 10

චාමින්ද හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

03.
2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය




ඒකීය-රුපි

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

කණ්ඩායම අගය ඉලක්කය 2025		සටහන	කණ්ඩායම 2025	කණ්ඩායම 2024	
			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1		-	
-	වැඩිය හංවඩු හා ගෙවිය යුතු බදු	2		-	ඒකීය-1
-	ප්‍රතිසාධනය කළහැකි වෙන බදු	3		-	
(අ) (i) සමාජ සංරක්ෂණ දායක මුදල් පළාත් සභා ආදායම් ගිණුම් යටතේ දායක වී නිවෙතා නිලධාරීන් , සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට විශ්‍රාම්වැටුප්දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණු බැවින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ආපසු ගෙවීම් යනාදී ප්‍රතිලාභ ගිවි ගැන්වීමේ දී දායක මුදල් ඒ ඒ පුද්ගලයාගෙන් නිශ්චිතව අවණ්ඩව ලැබුණේද යන්න දෙපාර්තමේන්තුවට සනාථ කරගැනීමේ නිසි ක්‍රමවේදයක් නොතිබුණි.

(ii) 2021 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියලුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් වෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මාසයකම අගභාගයේ 15 දිනට පෙර ගෙන්වා ගත යුතු වුවද පළාත් සභා 5 හ දින 05 සිට දින 100 දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

(iii) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අයත් ආදායම් සංකේත සඳහා මාසික වාර්තා එළඹෙන මාසයේ 10 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මාස 05ක කාර්යසාධන වාර්තා දින 12 ත් 45 ත් අතර ප්‍රමාද කාලයක් සහිතව ඉදිරිපත් කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයට අදාළ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 19,000 ක් ලෙස රජයේ ලද ශුද්ධ ආදායම් රු.මිලියන 22,507.7 ක්වූ අතර රජයේ ලද ශුද්ධ ආදායමේ වැඩිවීම් ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 18 ක් හා වඩාත්ම රු.මිලියන 3,507.7ක් වූ බව නිරීක්ෂණය වූ අතර ආදායම් ඇස්තමේන්තුව නාත්තඩික ලෙස සංශෝධනය කිරීමට පියවර නොගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අවසාන ගිණුම් තුළ මෙම වෙනසට හේතුවක් ලෙස වාර්ෂික වැටුප් වැඩිවීම ලෙස දක්වා තිබුණද ජූලි 21 දිනැති සංශෝධිත ඇස්තමේන්තුව ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් රාජ්‍ය සේවක වැටුප් වැඩිවී තිබුණි.

(v) 2024 ජනවාරි 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2024 අනුව 2024 අප්‍රේල් මාසයේ සිට වැන්දඹු අනන්දරු දායකත්වය ලෙස සියළුම රාජ්‍ය නිලධරයන්ගේ වැටුපෙන් සියයට 8 ක් අය කළ යුතු වුවද උතුරු පළාත් සභාව විසින් ඇතැම් නිලධරයන් වෙනුවෙන් 2024 මැයි සිට ඔක්තෝම්බර් දක්වා සියයට 6 හා සියයට 7 ප්‍රතිශතය යටතේ ද දායක මුදල් ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි පරිශ්‍ර 14ක් තුළ පදනම් මත ලබා දී තිබූ අතර 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු නිඹ කුලී ආදායම් රු.19,596,544 වූ අතර ඒ තුළ ආයතන 08කට අදාළව මාස 12 ඉක්මවූ නිඹ කුලී ආදායම් රු.14,401,044ක් විය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

2025 දෙසැම්බර් 31 දිනට බැරකම් රු.123,865ක් අඩුවෙන් දක්වා තිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වල, යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය	1,778,533	වැඩි නඟනම් කර ඇති නිලධාරීන් 06 දෙනෙකුගෙන් හා සේවය අනඟුර ගොස් ඇති නිලධාරීන් 04දෙනෙකුගෙන් අයවිය යුතු ණය මෙම ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2010 දෙසැම්බර් 16 දිනැති අංක 13/2010 දරන හා 2013 සැප්තැම්බර් 20 දිනැති අංක 03/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	256,250	යළි විවාහ වන වැන්දඹුවට වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුපෙන් හා දිමනාවලින් සියයට 50 ක් ගිණි ලුවද නැවත විවාහයෙන් පසුවද සම්පූර්ණ වැටුප හා දිමනා ගෙවා නිබීම නිසා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකු වෙත විශ්‍රාම වැටුප් හා දිමනා වැඩිපුර ගෙවීම් කර තිබුණි.
(ඇ)	2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ		විශ්‍රාමිකයෙකු මිය ඒවන විටදී දිමනාව සඳහාට රජයේ වැටුපක් ලබන්නේ නම් එලෙස වැටුප් ලබන කාලසීමාව තුළදී විශ්‍රාම වැටුපට මිය ඒවන විටදී දිමනාව නිති නොවේ. එසේ වුවද,
		25,047,838	(i) ගම්දා සේවා/පොලිස් සේවා මාසික වැටුප් ලබන විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප සමඟ මිය ඒවන විටදී දිමනාව ගෙවීම් හේතුවෙන් දන්න පද්ධතිය අනුව අවස්ථා 58කදී දඹොරණාගොට, මොණරාගල, ගලෙන්බිඳුණුවැව, ගලිගමුව, කටාන, පොල්පිතිගම, වැල්ලවාය, මිගමුව, දොම්පේ, ජා ඇළ, නිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 66කදී මිය ඒවන විටදී දිමනාව වැඩිපුර ගෙවීම් කර තිබුණි.
		8,182,525	(ii) රාජ්‍ය සේවකයෙකු තම මාසික වැටුප ලබමින් වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුපක් ලබා ගන්නා විට එකී විශ්‍රාම වැටුපට මිය ඒවන විටදී දිමනාව නොගෙවිය යුතු වුවද, එසේ මිය ඒවන විටදී දිමනාව ගෙවීම් හේතුවෙන් තමන්හඬුව, ඇලහැර, සොරණාතොට, බණ්ඩාරගම, දොඩන්ගොඩ, ගලෙන්බිඳුණුවැව, ගලිගමුව, කටාන, බෙන්තොට, ඇල්පිටිය, හිඟගොඩ, දික්වැල්ල, මිගමුව, රඹුව, ජා ඇළ, වත්තල,

				නිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 48 කදී ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා නිබුණි.
		8,037,500	(iii)	විශ්‍රාම වැටුපක් ලබමින් රජයේ වැටුපක් ලැබීම හේතුවෙන් විශ්‍රාම වැටුප අත්හිඳිවූ විශ්‍රාමිකයින්ගේ ජීවන වියදම් දීමනා ඔවුන් ලබන රජයේ වැටුප නතර වූ පසු ආපසු ගෙවීම ඇරඹිය යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් මොණරාගල, ගලෙන්බිඳුණු වැව, ගලිගමුව, කටාන, පොල්පිතිගම, මීගමුව, දොම්පේ, රඹුව, ජා ඇළ, වත්තල, නිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 30 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව අඩුවෙන් ගෙවා නිබුණි.
(ඇ)	2014 අප්‍රේල් 07 වන දිනැති අංක 01/2011 (සංශෝධන I) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය			විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා මාසික විශ්‍රාම වැටුප් වියදම විශ්‍රාමිකයන් සංඛ්‍යාවේ සිදුවන එකතු කිරීම් අඩු කිරීම් සංශෝධන ඇතුළත් වාර්තාවක් මාසිකව සකස් කර දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ පාලන ශිෂ්‍යම සමඟ සංසන්දනය කළ හැකි ක්‍රමවේදයකට පාලන ශිෂ්‍යමක් සකස් කළ යුතු වුවත් ජාඇල හා රඹුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එසේ සිදුකර නොතිබුණි.
(ඈ)	2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය"	662,750		විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගත්නා අවස්ථාවල මාසිකව ගෙවනු ලැබූ අත්තර් දීමනාව ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් රඹුව, ජා ඇල, වත්තල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හඳුනාගත් විශ්‍රාමිකයින් 06 දෙනෙකු සඳහා අත්තර් දීමනාව වැඩිපුර ගෙවා නිබුණි.
(ඉ)	2018 ජූනි 20 දිනැති අංක 01/2018 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය			
	(i) 5(iii) ඡේදය			වසර දෙකකට වැඩි වැඩි කාලයක් විදේශ ගත වීමකදී වර්තමානයේ විශ්‍රාම වැටුප් ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දී තම විශ්‍රාම වැටුප විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශයෙන් ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු වුවද එසේ සිදු නොකළ අවස්ථා 86 ක් මීගමුව, රඹුව, ජා ඇළ, වත්තල, නිරප්පනේ, ගලිගමුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් අනාවරණය විය.

	(ii) 06(b) ඡේදය	395,015	(i) විශ්‍රාමිකයා විදේශ ගත වන දින සිට නැවත පැමිණෙන දින තෙක් ජීවන වියදම් දීමනාව රු.2,000ක් වන පරිදි ගෙවීම් සිදු කළ යුතු වුවද එසේ ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ඉලිමළුව, දොම්පේ,මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 06 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනා වැඩිපුර ගෙවීම් කර තිබුණි.
		229,515	(ii) විදේශ ගතව සිටි විශ්‍රාමිකයාට ගෙවන ලද රු.2,000 දීමනාව එම විශ්‍රාමිකයා නැවත දිවයිනට පැමිණි පසු සංශෝධනය කර ගෙවිය යුතු වුවද එසේ නොගෙවීම හේතුවෙන් ඉලිමළුව හා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 02 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව අඩුවෙන් ගෙවීම් කර තිබුණි.
(c)	2019 ජූනි 11 දිනැති අංක 1/2019 දරණ විශ්‍රාම වැටුප් වක්‍රලේඛය	504,000	යම් සුදුලයෙකු වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ යැපීම් දීමනාව ලබාගන්නා අවස්ථාවක එම වැන්දඹු විශ්‍රාම වැටුප, වක්‍රලේඛ ප්‍රකාරව සංශෝධනය කළ පසු යැපීම් දීමනාව සඳහා ගෙවනු ලබන අත්තර් දීමනා ගෙවීම් නතර කළ යුතු වුවද ඉලිමළුව හා ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් දෙදෙනෙකු වෙත එසේ යැපීම් දීමනාව සඳහා ගෙවන අත්තර් දීමනාව නතර නොකර ගෙවීමෙන් අත්තර් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.
(d)	2019 ජූලි 26 දිනැති අංක 1/2019 සංශෝධන II දරණ විශ්‍රාම වැටුප් වක්‍රලේඛය	151,676	ත්‍රිවිධ හමුදා මඟින් ගෙවනු ලබන වයස අවුරුදු 55 දක්වා වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්ට හා යැපෙන්නන්ට වැටුප් පරිවර්තනය අදාල නොවන බව දක්වා තිබියදී දත්ත පද්ධතියට අනුව ඉලිමළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයකුගේ විශ්‍රාම වැටුප සංශෝධනය කර ගෙවීම් හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි.
(e)	2022 ජනවාරි 20 දිනැති අංක 01/2022 දරණ විශ්‍රාම වැටුප් වක්‍රලේඛය		
	(i) 2 ඡේදය	3,708,000	සොරණතොට, නාදල, මොණරාගල, ලෙනේබිදුණ වැව, ගිරිබාව, වැල්ලවාය, මීගමුව, රඹැව, ජා ඇළ, වත්තල, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 24 දෙනෙකු සඳහා ඔවුන්ට හිමි රු. 5,000 ක දීමනාව ගෙවා නොනිමීම හේතුවෙන් එම දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි.

	(ii) 2(i) ඡේදය	90,000	කිසියම් නැනැත්තෙකු විශ්‍රාම වැටුප් කිහිපයක් ලබන විට එවැනි නැනැත්තෙකුට හිමි වනුයේ ඔසකට එක් දීමනාවක් පමණක් වුවද විශ්‍රාම වැටුප් වර්ග කිහිපයක් සඳහා වෙන් වෙන් වශයෙන් රු.5,000 දීමනාව වැඩිපුර ගෙවීම් සිදුකළ අවස්ථා 01 ක් දොම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිරීක්ෂණය විය.
	(iii) 2(iii) ඡේදය	825,000	මියගිය ත්‍රිවිධ හමුදා නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ අවුරුදු 55 දක්වා වැටුප් හිමි යැපෙන්නන්ට විශ්‍රාම වැටුප සමඟ රු.5,000 විශේෂ දීමනාව හිමි නොවන බව දක්වා නිකුණද දත්ත පද්ධතියට අනුව යැපෙන්නන් 04 දෙනෙකු සඳහාද ගලිගමුව, කටාන, වැල්ලවාය, කිරිබත්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යැපෙන්නන් 06 දෙනෙකු සඳහාද සේවා වැටුප සමඟ දීමනාව ගෙවීම් කර තිබූ බැවින් විශේෂ දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.
	(iv) 2(iv) ඡේදය	30,000	විදේශ ගත විශ්‍රාමිකයින්ට රු.5,000 දීමනාව හිමි නොවන බව දක්වා නිකුණද ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් විදේශ ගත විශ්‍රාමිකයෙකු වෙත ගෙවීම් කර තිබුණි.
(ඒ)	2022 ජූනි 22දිනැති අංක 2022/14,)2022/14i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2022සැප්තැම්බර් 20 දිනැති අංක 2022/06 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	147,782,688	විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් විධිමත් පරිදි ලියාපදිංචි නොවීම නිසා වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනන්දරු දායක මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවනු ලැබුවද නිලධාරියා හඳුනාගත නොහැකි බැවින් දායක මුදල් මාසිකව හඳුනානොගත් ලැබීම් ලෙස පොදු නැන්පත් ගිණුමට මාරුකිරීම හේතුවෙන් නිරවුල් නොවූ ශේෂයක් නිරීක්ෂණය විය.
(ඇ)	2023 මැයි 02 දිනැති අංක MOT/2023/01 දරන නාක්ෂණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය		"රාජ්‍ය ආයතන සඳහා නොරතුරු හා සයිබර් ආරක්ෂණ නොරතුරු " ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇති අතර රාජ්‍ය ආයතන විසින් එය ක්‍රියාත්මක කළ යුතු වේ. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්තියේ ඇතුළත්ව ඇති නක්ශේරු නිර්ණායකවලට අනුගත වී නොතිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර විස්තර පහත දැක්වේ.
	ප්‍රතිපත්ති අංක 4.1.7		ආයතනය විසින් "ඉතා රහසිගත" හෝ "රහසිගත" නොරතුරු වන්කම් හෝ තීරණාත්මක ජාතික නොරතුරු යටිතල පහසුකම් සහිත පද්ධති සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගේ පසුබිම් පරීක්ෂණ සහ ආරක්ෂක නිශ්කාශන සිදු කර නොතිබුණි.

ප්‍රතිපත්ති අංක 4.2.1	ආයතනය සතු වටිනාකමක් ඇති තොරතුරු වත්කම් හඳුනාගෙන නිසියඳද තොරතුරු වත්කම්වල සංවේදිතාව හෝ වෙනත් ප්‍රතිපෝදනීය මත පදනම්ව වර්ගීකරණය (Classification of information Assets) කර නොතිබුණි.
ප්‍රතිපත්ති අංක 4.2.5	ආයතනය සතු තොරතුරු වත්කම් හා සම්බන්ධ අවදානම් නක්සේරු කර තොරතුරු වත්කම් ලේඛනයක (Information assets) සටහන් කර නොතිබුණි. තවද ආයතනය විසින් තොරතුරු තාක්ෂණ වත්කම් ඒවායේ තීරණාත්මකභාවය (Criticality) මත වර්ගීකරණය කළයුතු ඵලදායී ලෙස කර නොතිබුණි.
ප්‍රතිපත්ති අංක 4.3.7	විදුලින් නැපැල් ලිපිවල අඩංගු ඇති අනිෂ්ට මෘදුකාංග හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට ආයතනයේ විදුලින් තැපැල් පෙරහන් සක්‍රීය කොට නොතිබුණි. ආයතනය විදුලින් තැපැල් මගින් සංවේදී තොරතුරු හුවමාරු කරන විට ඡේදනය භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 නැන්පතු

(අ) වර්ෂ 02 ක් ඉක්මවූ රු. 14,723,027ක නැන්පතු, මුදල් රෙගුලාසි 571(3) පරිදි ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට බැඳීමෙන් තොරව පොදු නැන්පතු ගිණුමෙහි රඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය. මේ තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වැඩිදියුණු කිරීම සිදු කිරීමට අනුග්‍රහකත්වය ලෙස මොනිටෙල් ආයතනය වෙතින් ලද, ගුදාල කාර්යය සඳහා යොදවා නොගත් රු.14,222,000ක මුදලක් අන්තර් ගත බවද නිරීක්ෂණය විය.

(ආ) මොනිටෙල් ආයතනය හා දෙපාර්තමේන්තුව අතර පවතින 2023 මාර්තු මය 01 දිනැති අවබෝධතා ගිවිසුම් අනුව දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් වශයෙන් 2024 මැයි 29 දින මොනිටෙල් ආයතනය වෙතින් රු.5,000,000ක මුදලක් ද, 2025 අප්‍රේල් 07 දින රු.5,000,000ක්ද ලැබී තිබූ අතර මෙම මුදල් පොදු නැන්පත් ගිණුමේ නැන්පත් කර තිබුණි. අදාළ අවබෝධතා ගිවිසුමේ 4.8 ඡේදයේ අඩුපාඩු 2හි සඳහන් වැඩසටහන් සඳහා මෙම මුදල් භාවිතා කළ හැකි බව සඳහන් කර තිබුණ ද 2026 මාර්තු 31 දක්වාත් මෙම මුදල් උපයෝජනය නොකර නැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

2025 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශන හා අදාළ බැංකු ප්‍රකාශන පරීක්ෂාවේදී බැංකු 02 කට අදාළව හඳුනානොගත් ලැබීම් වටිනාකම් රු.1,286,943 ක් 2026 මැයි මාසය වන විට නිරවුල් කර නොතිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 පාඩු හා හානි

මූලෝ ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානා වන විට නවදුරටත් අයකර ගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වර්තුකම රු. මිලියන 1,130 ක් වී තිබුණි. මෙම ශේෂය වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත ඒන රු. මිලියන 13 ක් ද වර්ෂ 5 ත් 10 ත් අතර දක්වා කාල පරාසයක සිට පැවත එන රු. මිලියන 40 කින් ද වර්ෂ 5 කට අඩු කාලයකට අයත් රු. මිලියන 1,075 කින් ද සමන්විත විය.

4.2.1 කළමනාකරණ දුර්වලතා

(අ) ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 22-1000006 දරණ විශ්‍රාම වැටුපට අදාලව 2025 දෙසැම්බර් 31 දිනට අය කර ගැනීමට ඇති මූළු මුදල රු.111,530ක් වුවද 2017 අප්‍රේල් මස සිටම එම මුදල අය වී නොතිබුණි. දරුවාගේ වයස සම්පූර්ණ වීම මත 2022 අප්‍රේල් 03 දින අංක 4-23884 දරන යැපීම් දීමනාව, සංශෝධනය විය යුතු වුවද එසේ සංශෝධනය වී නොතිබුණි.

(ආ) ජාතික විගණන කාර්යාලයේ අංක සවිසිඑල්පී/පොද/වි.වි.2018 හා 2018 ඔක්තෝම්බර් 12 වන දිනැති විගණන විමසුමෙන් අනාවරණය කරන ලද කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් දෙදෙනෙකු ත්‍රිවිධ හමුදාවෙන් විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් ලබමින් සිටියදී රාජ්‍ය විෂ්ව විද්‍යාල වල ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගෙන වැටුප් ගෙවීම් නිසා වැඩිපුර ගෙවීම් කළ රු.415,975ක මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දෙපාර්තමේන්තුවෙන් 2018 නොවැම්බර් දින රහිත ලිපියක් මඟින් විමසීමක් සිදු කර තිබුණද ඒ සඳහා පිළිතුරක් ලබා දී නොතිබූ අතර මුදල අය කර ගැනීමද අයකර ද නොතිබුණි.

(ඇ) පොළොන්නරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 40-2040975 දරන විශ්‍රාමිකයා සඳහා 2021 ජනවාරි 30 දින සිට 2024 අගෝස්තු 15 දින දක්වා වූ මූලික වැටුප වැඩිපුර ගෙවීම් කිරීම හේතුවෙන් රු.2,324,371ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. විශ්‍රාමිකයාට ගෙවිය යුතු හිඟ මුදලින් රු.336,643ක මුදලක් 2026 ජනවාරි මස විශ්‍රාමිකයාගෙන් අය කර ගැනීමෙන් පසු නවදුරටත් රු.1,987,727ක මුදලක් අයකර ගැනීමට පැවතුණි. අදාල මොහුව ප්‍රධාන කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවා තිබුණද විගණන දින වන 2026 ජනවාරි 23 වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. කාර්යාලයේ හිඟ මුදල් සමඟ ප්‍රථම විශ්‍රාමික ගෙවීම් ආරම්භ කරන අවස්ථාවල දී මෙන්ම සමහර විශ්‍රාමිකයින්ගේ හිඟ මුදල් ගෙවීම් හා අවකරණ සිදු කරන අවස්ථාවල දී දත්ත පද්ධතිය අනුව හිඟ මුදල් හා අවකරණ දත්ත පෙන්නුම් කළත්, ඊට අදාළ ගණනය කිරීම් විස්තර ලිපි ගොනු තුළ ඇතුළත් නොවූණු බැවින් ගෙවීම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට නොහැකි විය.

(ඈ) විශ්‍රාමිකයින්ට වැඩිපුර ගෙවූ දීමනා නැවත අය නොකිරීමට අදාළ දත්ත පද්ධතිය පරීක්ෂාවෙදී නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් කෙරේ.

(i) විශ්‍රාමිකයෙකු තම විශ්‍රාම වැටුප සමඟ තම ස්වකාගේ හමුදා සේවා වැටුප ලබන අවස්ථාවල විශ්‍රාම වැටුප සඳහා ජීවන වියදම් දීමනාව ගෙවිය නොහැකි අතර එසේ ගෙවා තිබූ අවස්ථා ආයතනය විසින් අනාවරණය කර ගෙන තිබූ නිසා ජීවන වියදම් දීමනාව අත්හිටුවා තිබුණද, යැපෙන්නන් 56 දෙනෙකු සඳහා එතෙක් ගෙවා තිබූ රු.12,034,162ක ජීවන වියදම් දීමනා වැඩිපුර ගෙවීම් 2026 පෙබරවාරි දක්වාත් අය කරගෙන නොතිබුණි.

(ii) මියගිය විශ්‍රාමිකයින් තිදෙනෙකු සඳහා වැඩිපුර ගෙවීම් කර තිබූ රු.1,158,850ක ජීවන වියදම් දීමනාව ආපසු අය කර ගැනීමට නොහැකි බව නිරීක්ෂණය විය.

(iii) විශ්‍රාමිකයින්ගෙන් 17 දෙනෙකුට වැඩිපුර ගෙවන ලද රු.6,201,247ක මුදලක් නවදුරටත් අයවීමට ඇති බව දන්න පද්ධතිය පරීක්ෂාවේ දී අනාවරණය වූ අතර ඇතැම් විශ්‍රාමිකයින් මිය ගොස් සිටියද එම මුදල් නැවත අයකරගෙන නොමැති බවද නිරීක්ෂණය විය. නවද මෙම ශේෂයන් හානි පාඩු ලේඛනයේද ඇතුළත්ව වී නොතිබුණි.

(ඉ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 72466 දරන විශ්‍රාමිකයා 2024 සැප්තැම්බර් 23 දින මියගොස් තිබුණද එම විශ්‍රාමිකයාට 2025 මැයි 09 වන දින දක්වා විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම හේතුවෙන් රු.349,879ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) 2020 පෙබරවාරි 15 දිනැති අංක 03/2020 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව අනන්දරුවාගේ වයස අවුරුදු 18 සපිරුණු වහාම භාරකාරීත්වය ඉවත් කිරීමට කටයුතු කළ යුතු යුතු වුවද, රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 23-2046169 යටතේ ගෙවන අනන්දරුවාගේ වයස 2025 ඔක්තෝබර් 28 දිනට සම්පූර්ණ වන තෙක්, විශ්‍රාම වැටුප වැඩිමහල් සහෝදරියගේ භාරකාරීත්වය යටතේ ගෙවීම් සිදු කරන බව විගණනයේදී නිරීක්ෂණය විය. විශ්‍රාම වැටුප් අංක 23-2040390 යටතේ ගෙවෙන විශ්‍රාම වැටුප අනන්දරුවන් දෙදෙනෙකු වෙනුවෙන් ගෙවීම් කරන අතර වැඩිමහල් දරුවාගේ වයස 2023 ජූනි 24 දිනට අවුරුදු 18 සම්පූර්ණ වන නමුත් මාතෘකාවගේ භාරකාරීත්වය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

5 නිරසාර සංවර්ධනය

5.1 නිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

වසර 2030 දී ඉටුකර ගැනීමට ඉලක්ක කර ඇති නිරසාර සංවර්ධනය සඳහා වන අරමුණු යටතේ දෙපාර්තමේන්තුව විසින් එක් අරමුණක් පමණක් හඳුනාගෙන තිබුණි. එම අරමුණ සම්බන්ධයෙන් ද පැහැදිලි ඉලක්ක පිහිටුවා නොමැති අතර පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ක්‍රමවත්ව පිහිටුවීමක් සිදුකර නොතිබුණි. නිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාරය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් ද හඳුනාගෙන නොතිබුණි.

6 මානව සම්පත් කළමනාකරණය

(අ) විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් සඳහා කැලණිය වෙදමුල්ලේ ඉඳි කර ඇති නිවාඩු නිවාතනය පවත්වාගෙන යාම සඳහා වූ 2004 ජූනි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ආරම්භක වශයෙන් 2004 මැයි 26 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 04/0519/007/008 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 04 ඡේදයේ යෝජිත කාර්ය මණ්ඩලය,වාර්ෂිකව කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් හා මාසයකට රු. 30,000ක උපරිමයකට යටත්ව පාලක මණ්ඩලය මඟින් තීරණය කරනු ලබන පරිදි ඔවුන්ට මාසික වැටුප් හා දීමනා ගෙවිය යුතු වුවද, අමාත්‍ය මණ්ඩල තීරණයේ දැක්වෙන ස්ථාන භාර නිලධාරී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු විරිෂ ගණනාවක සිට බඳවාගෙන නොතිබුණ අතර කළමනාකරු (යෝජිත කාර්ය මණ්ඩලය තුළ නොමැති තනතුරකි) වශයෙන් විශ්‍රාම වැටුප් නිලධාරියෙකු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 මාර්තු 12 දිනැති අංක විවැ/පා05/බඳවා ගැනීම/I ලිපිය මඟින් දින සිට රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කර එම නිලධාරියා වෙත රු.20,000ක මාසික දීමනාවක් පාලක මණ්ඩලයේ තීරණය මත ගෙවමින් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13:7 වගන්තිය ප්‍රකාරව, සුරැකුම් වූ තනතුරක රාජකාරී ආවරණය කිරීම සඳහා යොදා ඇති දෙපාර්තමේන්තුමය වැඩ පිළිවෙළක් යටතේ එම රාජකාරී කටයුතු ආවරණය කරන නිලධරයාට අතිරේක පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකමක් නොමැති බව දක්වා තිබුණද කළමනාකරු වශයෙන් රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කළ නිලධරයා වෙත දීමනා ගෙවා තිබුණි.

(ඇ) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශ්‍රාමික නිවාඩු නිදහස්කිරීම සඳහා කලමනාකරු තනතුරක් අනුමත වී නොමැති අතර දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළද අනුමත තනතුරක් නොවන කලමනාකරු තනතුර සඳහා නිතර තනතුරක් දරන නිලධාරියෙකු වැඩ බාරගෙය කිරීම සඳහා යොදවා ගැනීම ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13 වගන්තියේ විධිවිධානවලින් බැහැරව කටයුතු කිරීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

කේ.කේ.එස්.සියනෝඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LSW/E/LGPF/26/01

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 ජූනි 25දින

විශ්‍රාම වැටුප් අධිකාරී ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවා සහ වෙනත් කොන්දේසි හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට අවසන් පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම හා වියදම් ගිණුම් සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම් කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාවනය සඳහා පදනම

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම් මත ගිණුම් තැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂවලට හා සමාලෝචිත වර්ෂයට අදාළව ලැබී තිබූ දායක මුදල් වූ රු.71,486,862 ක් මුදල් පදනමට ගිණුම් ගතකර නිබුණි.

(ආ) භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් සමාලෝචිත වර්ෂයේ විශ්‍රාමිකයින් සඳහා රු.946,164,110ක දායක මුදල් ගෙවා නිබුණි. පළාත් පාලන ආයතනවලින් වර්ෂය තුළ දායක මුදල් ලැබීම් රු.71,486,862 ක්වූ අතර විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවීම් ලෙස එම මුදල දායක මුදල් ලැබීමට වෙරහිව ගිණුම් ගතකර නිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සමිති ලැබීම් රු.71,486,862 ක්වූ අතර එම මුදලින් රු.17,154,464ක් ඉකුත් වර්ෂ සඳහා ලැබීම් වූවත් එම වර්ෂානුකූල, උපයනවිය ලෙස සම්මුවිත අරමුදලට මාරු කර ආදායම් වියදම් ගිණුමට ගලපා නිබුණි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | agt@auditorgeneral.gov.lk | www.naod.gov.lk

(ඇ) පළාත් පාලන ආයතන 134ක 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් රු.903,004,905 ක් වුවත් අදාළ පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල් රු.163,780,395ක් ලෙස අඩුවෙන් දැක්වීම හේතුවෙන් රු.739,224,510 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) පළාත් පාලන ආයතන 41 ක 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු දායක මුදල්වල එකතුව රු.17,002,487 ක් වුවත් අදාළ පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල්වල එකතුව රු.20,452,291 ක් ලෙස වැඩියෙන් දැක්වීම හේතුවෙන් රු.3,449,804 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 301 ක රු.1,034,003,520 ක් ලැබිය යුතු දායක මුදලින් පළාත් පාලන ආයතන 50 කට අදාළව රු.50,655,484 ක ලැබිය යුතු දායක මුදල් සඳහා ශේෂ නඟවුරු කිරීම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, ශේෂ පත්‍රයේ, ආදායම් හා වියදම් ගිණුමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් නඟවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට හොඳැකි විය.

මේ හේතුවෙන් ශේෂ පත්‍රය, ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකයෙන් වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිගමනය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය ක කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන් නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් නැතිම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. හෙතෙම වුවද, මෙම වියාචනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන

සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට හොඳකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලබාගැනීමට හොඳකිවූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය විභාවනය සඳහා පදනම් කොටගෙන් විශ්තර කර ඇති 1.2 (අ) (ආ) (ඇ) (ඈ) (ඉ) (ඊ) යන විගණන නිරීක්ෂණ හැර මූල්‍ය ප්‍රකාශනා ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් නිකුතකරන ලද නිර්දේශයන් මාගේ වාර්තාවේ විභාවනය කළ මතය සඳහා පදනම් කොටගෙන් විශ්තර කර ඇති 1.2 (අ) සිට (ඊ) විගණන නිරීක්ෂණ හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII වන කොටසේ 39(4) වගන්තිය යටතේ ප්‍රකාශිත විවේච්‍යාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන අරමුදල් සමාලෝචන කමිටුවේ නිර්දේශ අනුව මෙම අරමුදලට අදාල පහත සංශෝධනය කර විසා දැමිය යුතු බවට යෝජනා කර තිබූ අතර 2025 සැප්තැම්බර් 04 දිනැති අංක අමඑ/25/1531/804/179 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද මේ දක්වා අරමුදල විසා දැමීමේ කාර්ය නිම වී නොතිබුණි.

3.2. කාර්යසාධනය

(අ) පළාත් පාලන ආයතන 301 කින් 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.1,034,003,520 ක් වූවද, සමාලෝචන වර්ෂයේ කිසිදු දායක මුදලක් ලැබී නොතිබුණු පළාත් පාලන ආයතන සංඛ්‍යාව 66 ක් වූ අතර ලැබිය යුතු දායක මුදල්වල වටිනාකම රු.215,908,328ක් විය.

(ආ) පළාත් පාලන ආයතන 59 ක 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් රු.250,620,155ක් වුවත් අදාළ පළාත් පාලන ආයතන මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු දායක මුදලක් නොමැති බවට දැක්වීම හේතුවෙන් එම වටිනාකමින් මූල්‍ය ප්‍රකාශන වල වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2025 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 04ක ලැබිය යුතු දායක මුදල් ශේෂයක් නොමැති වුවත් අදාළ පළාත් පාලන ආයතන මූල්‍ය ප්‍රකාශනයන්හි එකතුව රු.8,158,957ක ගෙවිය යුතු දායක මුදල් ශේෂයක් පැවතුණි.

පිටුව 3 | 4

3.3. නඩුමනාකරණ ක්‍රියාකාරකම්

(අ) ලැබීම් ගෙවීම් සාරාංශයෙහි ඉකුත් වර්ෂ සඳහා ලැබීම් ද ඇතුළුව සමස්ත ලැබීම් ඇතුලත් වුවද වර්ෂ කිරීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ලෙස සටහන් කර නිබුණි.

(ආ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල යටතේ 2015 වර්ෂයේ සිට සාමාජිකයන්ගේ නාම ලේඛනයක් පවත්වා ගෙන ගියද එම නාම ලේඛණයේ මිය යන විශ්‍රාමිකයින්ගේ නම් ඉවත් නොකරන බැවින් යාවත් කාලීන කරන ලද සාමාජිකයන්ගේ නාම ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) පළාත් පාලන ආයතන 03ක අවසන් සාමාජිකයා ද මියගොස් තිබියදී වැඩිපුර අය කිරීම් හේතුවෙන් නැවත ගෙවිය යුතු දායක මුදල් රු.60,129 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඒ.ඒ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒල්එස්ඩබ්/ටී/ටීවරිස් /26/01 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 මැයි 10 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ගරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් කරුණු හා නියමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ගරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ සොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා යාථාර්ත තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කොළඹ අධ්‍යාපන කලාපයේ මැයි හා ජූනි මාස වලට අදාළ දායක මුදල් පිළිවෙලින් රු.4,924,207ක් හා රු.5,043,523ක්ද රජයේ අනුමත පෞද්ගලික පාසලකින් පුළු මාසයට අදාළ දායක මුදල් වන රු.281,320ක දායක මුදලද අරමුදලේ ආදායම් වියදම් ගිණුමේ වර්ෂයට අදාළ දායක මුදලට ගෙනා නොනිබුණු බැවින් වර්ෂයට අදාළ දායක මුදල රු.10,249,050ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2025 ජනවාරි 01 දිනට මුදල් ලැබිය යුතු දායක ශේෂයෙහි, කොළඹ කලාපයේ පාසලකින් ලද දායක මුදල වන රු.11,125ක මුදල වෙනුවට රු.122,104ක මුදලක් කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයේ දෙසැම්බර් ලැබීම් ලෙස සටහන් කිරීම නිසා ආදායම් වියදම් ගිණුමේ අවම්භක ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.110,979ක් වැඩියෙන් දක්වා තිබුණි.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naod.gov.lk

(ඇ) 2025 ජනවාරි 01 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂයෙහි පවතින 2022 දෙසැම්බර් සඳහා මහනුවර කලාපයේ පාසලකින් ලද දායක මුදල් වන රු.229,689ක මුදල් ලද බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි.

(ඈ) කොළඹ කලාපයේ පාසලකින් 2024 අගෝස්තු සඳහා ලැබිය යුතු දායක මුදල් වන රු.219,860ක මුදල් 2025 ජනවාරි 01 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂයෙහි අතුළත් කර නොතිබුණු බැවින් ආරම්භයේ ලැබිය යුතු දායක මුදල් ශේෂය අඩුවෙන් දක්වා තිබූ අතර එම මුදල් සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස ගලපා තිබූ බැවින් වර්ෂයට අදාල දායක මුදල් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂයෙහි පවතින රු.236,838ක් මහනුවර කලාපයේ ජාසලකින් අගෝස්තු ලැබිය යුතු දායක මුදල් ලෙස සටහන් කළද එම පාසලෙන් අදාල මාසය සඳහා රු. 235,686ක මුදලක් දායක මුදල් ලෙස ලැබී තිබූ බැවින් ආදායම් හා වියදම් ගිණුමෙහි 2025 වර්ෂයට අදාල දායක මුදල් රු.236,838ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) කොළඹ කලාපයේ පාසැලකින් ජූනි මාසයට අදාලව රු.97,353ක්වූ විශාල දායක මුදල් ලැබීම් ගරු වැන්දඹු අනන්දරු අරමුදලේ දායකය ලෙස හඳුනාගෙන තිබූ බැවින් එම මුදලින් ආදායම් හා වියදම් ගිණුමෙහි වර්ෂයට අදාල දායක මුදල් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ගිණුම්කරණ සටහන් අංක 04 යටතේ වර්ෂයට අදාල දායක මුදල් ගණනය කිරීමේදී වැරදි බැර නිවැරදි කිරීම් වශයෙන් රු.2,051,711ක් හඳුනාගෙන තිබුණද විගණනයට නහවුරු වූ වැරදි බැර නිවැරදි කිරීම් මුළු අගය රු.1,914,168ක් වන අතර ඒ අනුව රු.137,543ක් වැඩියෙන් ගැලපීම් හේතුවෙන් දායක මුදල් ලැබීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) කළුතර අධ්‍යාපන කාර්යාලයේ පාසලකින් 2025 අගෝස්තු මස දායක මුදල් හා ගිණ වාරික දායක මුදල් ලෙස ලැබූ රු.209,538 ක මුදල් දායක මුදල් ලැබීම් යටතේ සටහන් කර නොතිබූ බැවින් වර්ෂයේ දායක මුදල් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූලා ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය යදහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාධාය ප්‍රකාශයන්ගෙන් තොරව මූලා ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූලා ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල පැවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් නැතීම් හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සැකිවන පරිදි ප්‍රවේණිය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙන් එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගනුවා මෙවැනි වන තත්ත්වයක් නොවනු ඇත. වංචා සහ වැරදි නැති හෝ සාමූහික ලෙස බලපෑම්, නීතිය ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකළිලිසහිතව යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් කවුරුවත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුෂ්කරතාවයෙන්, වසාදැමීමක සැකසීමෙන්, වෙනකරන්වීම මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳ යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය නිර්ණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වෙනස්කරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වසුහය හා අන්තර්ගතය සඳහා සාදන ලද හනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්මත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන කොයාකැතීම, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන ආරක්ෂාවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සම්බ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ කුන්ත්වාගණනය කළ මානය සඳහා පදනම් කොටසේ 1.2 හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිරීක්ෂණයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම


නීති,රීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත	
(i) නියෝග අංක 04	ගුරු වැන්දඹු දායක මුදල් වලින් අරමුදලක් ගොඩනඟා එමගින් ගුරු වැන්දඹු අනාත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම කල යුතු වුවද, දායක මුදල් රැස් කිරීම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වා නොගෙන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට දායක මුදල් රැස්කර තිබුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් කර තිබුණි.
(ii)නියෝග අංක 9(අ)	එක් එක් දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා දායක මුදල් ගෙවන්නන් පිළිබඳ නොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ආ) 2024 ජනවාරි 10 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 2024(3)	කොළඹ අධ්‍යාපන කලාපයට අයත් පාසැල්වල වැන්දඹු හා අනාත්දරු දායක මුදල් පාසැල් විවිධමින් දායක මුදල් එකතුවක් පමණක් තහවුරුවක් වන බැවින් ඔවුන්ගෙන් වැන්දඹු හා අනාත්දරු දායක මුදල් සඳහා සියයට 8 ක දායකත්වයක් ලැබෙන්නේද යන්න තහවුරු නොවුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) සාමාජිකයන්ගේ නම්, පාසල, ඇතුළත් ලේඛනයක් නඩත්තු නොකිරීම හේතුවෙන් අරමුදලට වාර්ෂිකව සහභාගී වගයෙන්ම ලැබිය යුතු මුදල, ලැබූ මුදල හා ඒහා මුදල්, අරමුදලේ සාමාජික සංඛ්‍යාව,සමාලෝචිත වර්ෂයේ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව හා අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව පිළිබඳව නොරතුරු නිවැරදිව සඳහන්කැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අරමුදලේ අරමුණු ඒකාබද්ධ අරමුදලේ 253 දරන චියර්ජන ගිරිෂයෙන් ඉටුවන බැවින්, මෙම අරමුදල අනාවශ්‍ය නොවූවද අරමුදලට අදාල පනත් සංශෝධනය කළයුතු බවට යෝජනා වී තිබුණද එම යෝජනාව ඔමතෙක් ඉටුවී නොතිබුණි.

කේ.කේ.ඩබ්.ඩයසේකර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LSW/E/PSPF/26/01

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 11 JUN 2026

2026 ජූනි 09 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරන විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) වගවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කර ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සහතා හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධව සමස්තයක් ලෙස බැලීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදල වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ප්‍රවේශීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත අරමුදලේ පාලක මණ්ඩලය විසින් මා වෙත දැන්වීම අවශ්‍ය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන නහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නැති හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්මක මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අදාළවලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අදාළවලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අදාළවලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අදාළවලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල වපුභය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්ස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- හොරහුරු ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් බලන කළ අදාළවලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර නිබෙද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබෙ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අදාළවලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අදාළවල ක්‍රියා කර ඇති බව,
- අදාළවල සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- අරමුදල සමපන් පිරිමැසුම්දායිව, කාර්යක්ෂමව සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නියාමනවලට අනුකූලව ප්‍රයෝජනය කර භාවිතා කර ඇති බව,

1.4 මූල්‍ය ප්‍රකාශන

1.4.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් සොයාගැනිණි.

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවධානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ පොලී ආදායම් උපචිත පදනම් මත ගිණුම් ගත කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පොළිය මුදල් පදනම මත හඳුනාගත් බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පොලී ආදායම් උපචිත පදනම් මත ගිණුම් තැබිය යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශන තුළ ස්ථාවර තැන්පතු සඳහා 2025 වර්ෂයට අදාළ පොලී ආදායම් රු.1,738,239ක් අඩුවෙන් ගණනය කර ගිණුම් ගත කිරීම නිසා, වර්ෂයේ පොලී ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	ස්ථාවර තැන්පතු සඳහා 2025 වර්ෂයට අදාළ පොලී ආදායම් රු. 1,738,239.00ක් අඩුවෙන් ගණනය කර ඇති බව පෙන්වා දී ඇතත් එය පිළිගත නොහැක.	ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	මූල්‍ය ප්‍රකාශන තුළ ස්ථාවර තැන්පතු සඳහා 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම් රු.15,533,270ක් වැඩියෙන් ගණනය කර දක්වා තිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	ස්ථාවර තැන්පතු සඳහා 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම් රු. 15,533,270.00ක් වැඩියෙන් ගණනය කර ඇති බව පෙන්වා දී ඇතත් එයද පිළිගත නොහැක.	ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.

පිටුව 3 | 7

(උ)	මූල්‍ය ප්‍රකාශන තුළ REPO සඳහා 2025 වර්ෂයට අදාළ පොලී ආදායම රු.1,420,181ක් වැඩියෙන් ගණනය කර ගිණුම් ගත කිරීම නිසා වර්ෂයේ පොලී ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	2026 ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට සටහන් කරගත් බව.	ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.
(ඒ)	මූල්‍ය ප්‍රකාශන තුළ REPO සඳහා 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු.1,422,088ක් වැඩියෙන් ගණනය කර දක්වා තිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	2026 ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට සටහන් කරගත් බව.	ලැබිය යුතු ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.

1.4.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

	විෂය	මුදල රු. මිලියන	නොසැපයූ විගණන සාක්ෂි	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවධානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එක් එක් දායකයා හා ආයතනය දැක්වෙන පරිදි උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ රජයේ දායක මුදල් ගිණුමේ ශේෂයේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	227.6	කේවල ශේෂ උපලේඛන	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2025 වසර ආරම්භයේ දී දියත් කළ නව ක්‍රමවේදය අනුව ඕන් ඉදිරියට මෙම ශේෂයන් එක් එක් ආයතන අනුවත් නිළධාරීන් අනුවත් හඳුනාගත හැකි අතර පෙර සිට පැවත එන මෙම ශේෂය නිළධාරීන් හට ගෙවීම් කිරීමක් සමඟ අඩුවේගෙන යනැයි අපේක්ෂා කරන බව	ශේෂය නිවැරදි කිරීමට අවශ්‍ය පරිදි උපලේඛන ඉදිරිපත් කළ යුතුය.
(ආ)	එක් එක් දායකයා අනුව වෙන් කළ හැකි පරිදි කේවල	43,087.5 66,095.1	කේවල ශේෂ උපලේඛන	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු	2025 වසර ආරම්භයේ දී දියත් කළ නව ක්‍රමවේදය	ශේෂය නිවැරදි

පිටුව 4 | 7

	ශේෂ උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් අනිවාර්ය දායක මුදල් හිඟුමේ ශේෂය හා රජයේ දායක මුදල් හිඟුමේ. ශේෂයෙහි නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.				කිරීම අවශ්‍ය වේ.	අනුව මින් ඉදිරියට මෙම ශේෂයන් එක් එක් ආයතන අනුවත් නිළධාරීන් අනුවත් හඳුනාගත හැකි අතර පෙර සිට පැවත එන මෙම ශේෂය නිළධාරීන් හට ගෙවීම් කිරීමත් සමඟ අඩුවෙගෙන යනැයි අපේක්ෂා කරන බව	තාවය තහවුරු කරගත හැකි පරිදි උපලේඛන ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	ස්වේච්ඡා දායක මුදල් හිඟුමේ ශේෂය සම්බන්ධයෙන් හිමිකම් ලබන්නන්ගේ තොරතුරු සහිත උපලේඛන විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයෙහි නිවැරදිභාවය තහවුරු තහවුරු කර ගැනීමට නොහැකි විය.	67.0	හිමිකම් ලබන්නන් ගේ තොරතුරු සහිත උපලේඛන	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2025 වසර ආරම්භයේ දී දියත් කළ නව ක්‍රමවේදය අනුව මින් ඉදිරියට මෙම ශේෂයන් එක් එක් ආයතන අනුවත් නිළධාරීන් අනුවත් හඳුනාගත හැකි අතර පෙර සිට පැවත එන මෙම ශේෂය නිළධාරීන් හට ගෙවීම් කිරීමත් සමඟ අඩුවෙගෙන යනැයි අපේක්ෂා කරන බව	ශේෂය න්හි නිවැරදි තාවය තහවුරු කරගත හැකි පරිදි උපලේඛ න ඉදිරිපත් කළ යුතුය.
(ඉ)	1989 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන ගැලපුම් හිඟුමේ ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.	5.6	කාල විශ්ලේෂ ණය	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	කාල විශ්ලේෂණයක් සිදු කර ගැනීමට නොහැකි වූ බව.	ආයතන මට්ටමි න් හඳුනාගැ නීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 12,576.55 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 13,278.43ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩු වීමට ආයෝජන මත පොළී ආදායම් රු.මිලියන 701.88 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

පිටුව 5 | 7

3. මෙහෙයුම් සමාලෝචන

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවධානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂය අවසානා වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක විසින් එම දිනයේ දී අරමුදලේ තමාගේ නමින් බැරට පවත්නා මුළු මුදල් ප්‍රමාණය එක් එක් දායකයා වෙත දැනුම් දිය යුතු වුවත් එම අවශ්‍යතාවය ඉටු කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	පිළිතුරු ලබා දී නොමැත.	පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ)	රු.12,576,550,809ක්වූ පොලී ආදායම දායකයින් අතර විසර්ජනය කිරීම සඳහා ආරම්භක මාසික වෙන් කිරීම් වටිනාකමෙන් සාමාන්‍ය අගයක් පදනම් කොටගෙන අනුපාතය තීරණය කර තිබුණු අතර එමඟින් පොලී ආදායම් දායකයින් අතර සම්පූර්ණයෙන් බෙදීයාමක් සිදුනොවන බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දී රු.3,679,090,761 ක්වූ පොලී ආදායමක් දායකයින් අතර නොබෙදා පොදු සංචිතයට මාරුකර තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	පිළිතුරු ලබා දී නොමැත.	එයිමත් පදනමක් අනුමත කර ගත යුතුයි.
(ඇ)	2016 දෙසැම්බර් 23 දිනැති අංක 4/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 3 උප වගන්තිය පරිදි රජයේ නිලධාරියකු විසින් කිසිම තුටු පඬුරක්, තෑගි	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ව්‍යදම් වූ ආකාරය සඳහා ගෙනුවක් පවතින බව	ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුගත විය යුතුය.

පිටුව 6 | 7

ඛෝගයක් හෝ වෙනත් ප්‍රතිලාභ ප්‍රයෝජනාදියක් කෙලින්ම හෝ අත් කෙනෙකුගේ මාර්ගයෙන් භාර ගැනීම ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනය යටතට ගැනෙන වරදක් බව දන්වා ඇතත්, රාජ්‍ය බැංකු 03කින් රු.150,000ක මුදල් ආධාර ලබා ගෙන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ කාර්ය මණ්ඩලය සඳහා 2025 ජූනි 29 දින සුභද හමුවක් පවත්වා තිබුණි.

එච්.එම්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටුව 7 | 7

04.
කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
නව විශ්‍රාම වැටුප් ප්‍රදානය	විශ්‍රාම වැටුප් ප්‍රදානය - විමධ්‍යගත	2025 වර්ෂයේ විශ්‍රාම වැටුප් ප්‍රදාන ලබාගත් විශ්‍රාමිකයින් ගණන	36,000	-	77.1%	-	-
	විශ්‍රාම වැටුප් ප්‍රදානය- මධ්‍යගත		2,400	-	76.5%	-	-
	වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය		9,000	96.9%	-	-	-
සංශෝධන ගෙවීම්	විශ්‍රාම වැටුප් සංශෝධන - විමධ්‍යගත	ගෙවූ සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රමාණය	3,840	-	-	-	23.4%
	විශ්‍රාම වැටුප් සංශෝධන - මධ්‍යගත		900	-	-	-	33.9%
පාරිතෝෂික හා වෙනත් ගෙවීම්	මරණ පාරිතෝෂික	මරණ පාරිතෝෂික ගෙවන ලද අයදුම්පත් සංඛ්‍යාව	1,250	102.5%	-	-	-
	ආබාධිත විශ්‍රාම වැටුප්	ගෙවූ ආබාධිත විශ්‍රාම වැටුප් සංඛ්‍යාව	8,500	-	-	66.4%	-
	සත්කාර පියස	සම්මුඛ පරීක්ෂණයටකැඳවන ලද සංඛ්‍යාව	36,000	-	76.3%	-	-
මාසික විශ්‍රාම වැටුප්	මාසික විශ්‍රාම වැටුප්- සිවිල්	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	320,969	99.8% (මූල්‍ය ප්‍රගතිය)	-	-	-
	පාරිතෝෂික ගෙවීම	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	44,800	99.5% (මූල්‍ය ප්‍රගතිය)	-	-	-

කාර්ය සාධන දර්ශක

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තක්සේරු නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
සමාජ සුභසාධන	ත්‍රිවිධ හමුදා සහ පොලිස්	මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන	50,000	99.6% (මූල්‍ය ප්‍රගතිය)	-	-	-
වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම	මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන	80,000	98.7% (මූල්‍ය ප්‍රගතිය)	-	-	-
දුම්රිය බලපත්‍ර	විශ්‍රාමිකයින් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම	මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන	455	100%	-	-	-
විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම	සිවිල් විශ්‍රාම වැටුප්,විදේශීය සිවිල් විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම	විශ්‍රාමිකයින් හා වැන්දඹුවන් සංඛ්‍යාව	500	-	-	50%	-
	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, විදේශීය වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම		150	-	-	-	46%
	හමුදා විශ්‍රාම වැටුප් විදේශ හමුදා විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම		200	99%	-	-	-
	විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ නව වැන්දඹු විශ්‍රාම වැටුප් විවෘත කිරීම		120	-	-	-	46.7%

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම (විදේශගත විශ්‍රාමිකයින්සඳහා)	14/2019 චක්‍රලේඛය අනුව අඩු නොකල විශ්‍රාම වැටුප් ගෙවීම	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	180	-	-	-	16.7%
හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම(විදේශගත විශ්‍රාමිකයින් සඳහා)	විශේෂ කමිටු අනුමැතිය මත රු.750,000-1,500,000 දක්වා වටිනාකමක් සහිත හිඟ මුදල් ගෙවීම	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	150	-	78%	-	-
	විශේෂ කමිටු අනුමැතිය මත රු.1,500,000/= ට වැඩි වටිනාකමක් සහිත හිඟ මුදල් ගෙවීම	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	90	-	-	70%	-
විදේශ විශ්‍රාමිකයින්ගේ වාර්ෂික ජීවිත සහතික යාවත්කාලීනකිරීම	2025 වාර්ෂික ජීවිත සහතික යාවත්කාලීන කිරීම	මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	8,500	100%	-	-	-
ඩෝල (Dalor) ලිපි නිකුත් කිරීම		මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	200	120%	-	-	-
දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම(විදේශවිශ්‍රාමිකයින්සඳහා)		මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන	150	-	-	71.3%	-

කාර්ය සාධන දර්ශක

ක්‍රියාකාරකම	උපක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තක්සේරු නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
දත්ත පද්ධති යාවත්කාලීන කිරීම(Deaths, transfer to DS, status changes, ect…)			480	-	81.7%	-	-
හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම	සිවිල්	විශ්‍රාමිකයින් ගණන	9,000	126.7%	-	-	-
	හමුදා						
	විෂමතා						
වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආදායම	මධ්‍යම රජය	මාසික අදායම	43,000*	-	76.7%	-	-
	පළාත් සභා	මාසික අදායම	27,000*	-	83.4%	-	-
	ගුරු වැන්දඹු අනත්දරු	මාසික අදායම	600*	112.5%	-	-	-
වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම	සිවිල්	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	1,500	-	87.4%	-	-
	හමුදා	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	2,500	-	-	61%	-
	ගුරු වැන්දඹු අනත්දරු	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	50	112%	-	-	-
	පොදු 29	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	24	-	-	-	41.7%
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල	රා.සේ.අ.අ. සාමාජිකයින් සංඛ්‍යාව	වාර්ෂික නව සාමාජිකයින් සංඛ්‍යාව	6,000	-	-	-	44%
	දායක මුදල් ගෙවීම්	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	5,700	106.6%	-	-	-
	දායක මුදල් ලැබීම්	මාසික දායකත්වය 8% හා 12%	1,020*	-	-	69.5%	-
	ආයෝජන	වර්ෂය තුල සිදුකරන ලද නව ආයෝජන	9,671*	-	-		18.1%

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
මානව සම්පත් සංවර්ධනය	ධාරිතා සංවර්ධනය	පුහුණු සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම	43 පුහුණු වැඩසටහන්	144.2%	-	-	-
දෘඩාංග පහසුකම් සංවර්ධන කටයුතු	දෘඩාංග මිලදී ගැනීම	පරිගණක	70	100%	-		-
		UPS	315		75%	-	-
		පරිගණක	70		75%	-	-
සයිබර් ආරක්ෂාව සහ දත්ත ආරක්ෂණය	Standerd Backup Solution			-	-	-	10%
	Full Mail Server Failover Project			-	-	-	10%
පද්ධති ආරක්ෂාව	වෛරස් ආරක්ෂණ උපකරණ මිලදී ගැනීම		-	100%	-	-	-
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	දෙපාර්තමේන්තු පරිශ්‍රය සංවර්ධනය	2025 වර්ෂය තුල සියළුම ව්‍යාපෘති අවසන් කිරීම		-	-	-	66.4%
	රම්බොඩ හා කැළණිය නිවාඩු නිකේතනය නවීකරණය කිරීම			-	-	-	
	වාහන			95.2%	-	-	-
	යන්ත්‍ර හායන්ත්‍රෝපකරණ			-	-	70.9%	-
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ		අවශ්‍යතාව පරිදි	100%	-	-	-
	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ		අවශ්‍යතාව පරිදි	100%	-	-	-

කාර්ය සාධන දර්ශක

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
අභ්‍යන්තර විගණන කටයුතු	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		01	100%	-	-	-
	විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම		4	100%	-	-	-
	ප්‍රාදේශීය ලේකම් කාර්යාල විගණන පරීක්ෂණ		16	-	-	-	43.8%
	රු.ලක්ෂ 15ට වැඩි විශ්‍රාම වැටුප් ලිපි ගොනු පරීක්ෂාව		450	104.4%	-	-	-
	විශේෂ විමර්ශන (අවශ්‍යතාව පරිදි)		8	-	-	50%	-
	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර අංශ විගණනය කිරීම		6	-	-	50%	-
	මධ්‍යම දත්ත පද්ධතිය සමාලෝචනය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව)		50	-	-	70%	-
	වෙනත් විගණන කාර්යයන්		200	116.5%	-	-	-

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස නත්‍ය නිමැවුම			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
ප්‍රතිපත්ති හා විමර්ශන කටයුතු	අනියම්, ආදේශක, තාවකාලික,කොන්ත්‍රාත්, සහන, උපාධිධාරී අභ්‍යාසලාභී, පුහුණු, ත්‍රිවිධ හමුදා සේවා කාල විශ්‍රාම වැටුප ගණනයට අදාළ කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීම	අනුමැතිය ලබා දුන් ගොනු සංඛ්‍යාව	480	117.9%	-	-	-
	මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත්වූ පෙත්සම් වලට අදාළව නිර්දේශ වාර්තා යොමුකිරීම	ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව	20	100%	-	-	-
	පාර්ලිමේන්තු වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා ලබා දීමට නිර්දේශිත පිළිතුරු සකස් කර ඉදිරිපත් කිරීම	යොමුකරන ලද පිළිතුරු සංඛ්‍යාව	7	100%	-	-	-
	අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා වෙත ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත්කරන ලද යෝජනා සඳහා නිරීක්ෂණ/ නිර්දේශ ඇතුළත් වාර්තා සකස් කර යොමුකිරීම	යොමුකරන ලද වාර්තා සංඛ්‍යාව	10	100%	-	-	-

කාර්ය සාධන දර්ශක

ක්‍රියාකාරකම	උප ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක	ඇස්තමේන්තුගත ප්‍රමාණය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස නත්‍ය නිමැවුම්			
				100%-90%	75%-89%	50%-74%	49% ට අඩු
ප්‍රතිපත්ති හා විමර්ශන කටයුතු ප්‍රතිපත්ති හා විමර්ශන කටයුතු	ආංශික අධීක්ෂණකාරක සභා විසින් යොමුකරන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අදාළ නිර්දේශ සකස් කර ඉදිරිපත් කිරීම	යොමු කරන ලද වාර්තා සංඛ්‍යාව	0	-			
	විශ්‍රාමිකයින්ගේ ගැටළු සම්බන්ධයෙන් විශ්‍රාමික සංගම් සමඟ සාකච්ඡා පැවැත්වීම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව (කාර්තුවකට රැස්වීම් 01 බැගින්)	2	150%	-	-	-
	අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම	යොමුකරන ලද නිරීක්ෂණ සංඛ්‍යාව	4	100%	-	-	-
	විශ්‍රාම වැටුප් චක්‍රලේඛ නිකුත් කිරීම හා උපදෙස් ලිපි නිකුත් කිරීම	නිකුත් කරන ලද චක්‍රලේඛ/ උපදෙස් ලිපි සංඛ්‍යාව	16	100%	-	-	-
	පුද්ගලයින් වෙනත් ආයතන සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ වෙතින් යොමු කරන ගැටළු සඳහා ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම	ලබා දුන් තීරණ සංඛ්‍යාව	240	93%	-	-	-

* - ආදායම් ලැබීම්

05.
තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
01.කොතනක හෝ පවතින ඕනෑම ආකාරයකින් වන දුගීබව අවසන් කිරීම.	1.3. 2030 වනවිට සාධාරණ හා තිරසාර හා සමාජ ආරක්ෂණ ක්‍රමයක් පිහිටුවීම හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	1.3.1.f.i. රජයේ විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව)			

5.1.හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

2025 වර්ෂයේ විශ්‍රාමිකයින් 740,881 ක් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කර ඇති අතර ස්ත්‍රී පුරුෂභාවය අනුව එම පුද්ගලයින්ගේ අනුපාතය පහත පරිදි දක්වා ඇත.

ස්ත්‍රී - 49.2%

පුරුෂ - 50.8%

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

මෙරට සෑම පුරවැසියෙකුටම විශ්‍රාම වැටුප් හිමිකමක් ලබාදීමට අදාලව යෝජනා ඉදිරිපත් කරමින් “සැමට විශ්‍රාම” ප්‍රතිපත්තිමය යෝජනාවලිය ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන ආයතන වෙත ඉදිරිපත් කරඇති අතර එය රාජ්‍ය ප්‍රතිපත්ති මත ද තීරණය වන්නකි.

එමෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු ආඥා පනත ආදී නෛතික රාමු හා රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණ වලට අනුව විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ප්‍රතිපත්ති හා බද්ධ වේ.

තවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත වගකීම් යොමු වන බව සඳහන් උප දර්ශකය (1.3.1.f.i.) වන රජයේ විශ්‍රාම වැටුපක් ලැබෙන වයස්ගත ජනගහනය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව හුදෙක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් කළමනාකරණය කළ නොහැකිය. අර්ධ රාජ්‍ය ආයතන සේවක අර්ථසාධක අරමුදල වැනි පසු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමවේද පවතින අතර, තාවකාලික රැකියා සහ ස්වයං රැකියා සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් ඇති කිරීමට නම් එයට අදාල වන සියළු අංශ සහ ආයතන එක්ව කටයුතු කළයුතු වන අතර මේ සඳහා සියළු ආයතන සමඟ සම්බන්ධතා පවත්වනු ලබන කම්කරු දෙපාර්තමේන්තුව, සමාජ සේවා අමාත්‍යාංශය හා කෘෂි රක්ෂණ මණ්ඩලය වැනි ආයතනයන්හි දායකත්වය ලබා ගත යුතුවේ. එබැවින් එවැනි ආයතන මැදිහත්වීමකින් තොරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් අදාල ඉලක්ක, දත්ත හා ප්‍රගතිය මැනීමේ දර්ශක යනාදිය හඳුනා ගැනීම ප්‍රායෝගික නොවේ.

06.
මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	35	26	09
තෘතියික	11	08	03
ද්විතියික	1102	1021	81
ප්‍රාථමික	97	76	21
එකතුව	**1245**	**1131**	**114**

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	පුහුණු වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේස්වභාවය (විදේශීය /දේශීය)
			දේශීය	විදේශීය	
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්යාල කාර්යසහයක නිලධාරීන් සඳහා ආචාර ධර්ම සහ විනය සම්බන්ධ පුහුණු වැඩසටහනක් පැවැත්වීම. සංග්‍රහ වියදම්	54	පෙ.ව 10.00 - ප.ව 1.00	3000.00 (සම්පත් දායක දීමනා) 12,470.00		දේශීය
තොරතුරු පද්ධතිය සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් නිලධාරීන් දැනුවත් කිරීම	122	2025.01.30 ප.ව 1.30 - ප.ව 3.00	මාර්ගගත		
PD3 අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන් හි විෂය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වූ මාර්ගගත පුහුණු වැඩසටහන	1492	2025.02.18 පෙ.ව 9.30 - ප.ව 1.00	මාර්ගගත		
Introduction to new warrant System	530	2025.02.25 ප.ව 12.30 - ප.ව 4.00	මාර්ගගත		

වැඩ ක්‍රියාවලීන් නැවත විමර්ශනයක් තුළින් වැඩ පහසු කර ගැනීමේ වෑයමක් කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ පැවැති වැඩසටහන ආහාරපාන වියදම් තේ වියදම්	23	2025.02.22 පෙ.ව 8.30 - ප.ව 5.00	39,085.00 5775.00		
ලේඛන සහකාර I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාළ පුහුණුව	95	2025.03.11,12 හා 2025.03.25 හා 26	576,155.56 (පසුගිය වසරේ ප්‍රතිපාදන මඟින් ගෙවීම් සිදු කර තිබේ)		දේශීය
මධ්‍යගතගත විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ මාර්ගගගත සැසිය (සිංහල මාධ්‍ය)	248	2025.03.20 පෙ.ව 9.30 - ප.ව 12.00	මාර්ගගත		
මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් මාර්ගගත වැඩසටහනක් පැවැත්වීම	175	2025.03.27 පෙ.ව 9.30 - ප.ව 12.00	මාර්ගගත		
කැළණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේදී පැවති විශ්‍රාම වැටුප් නිලධාරීන් සඳහා වන එක්දින වැඩසටහන	155	2025.04.03 පෙ.ව 8.30 - ප.ව 3.00	165,615.00 9,656.00		
අයවැය යෝජනා අනුව විශ්‍රාම වැටුප් ගැළපීම පිළිබඳව දිස්ත්‍රික් විශ්‍රාම වැටුප් සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීමේ එක්දින වැඩසටහන	27	2025.05. 27	සංග්‍රහ සඳහා රු 40,000.00		
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2025 සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත සැසියක් පැවැත්වීම	452	2025.06.06	මාර්ගගත		
විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමට අදාළ පරිශීලක අත්පොත (User Manual) සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප්	811	2025.06.21	මාර්ගගත		

දෙපාර්තමේන්තුවට අයත් විශ්‍රාම වැටුප් සැකසීමෙ ක්‍රියාවලියේ නිරත නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.					
විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමට අදාළ පරිශීලක අත්පොත (User Manual) සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් හා ගණකාධිකාරීවරුන් දැනුවත් කිරීමේ මාර්ගගත සැසිය	664	2025.06.24	මාර්ගගත		දේශීය
රාජ්‍ය භාෂා පැය 150 දෙමළ භාෂා පාඨමාලාව සඳහා නිලධාරීන් 22 ක් සම්බන්ධ වීම. රාජ්‍ය භාෂා පැය 150 සිංහල පාඨමාලාව (ෆෙරෝසා මිය සහභාගී විය)	22 01	2025.06.22 පැය 150	56,250.00 මාර්ගගත		
අල්ලසයෙන් හා දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක් සම්බන්ධ පුහුණු වැඩසටහන	73 (75)	2025.07.18	36,535.00 4800.00 4200.00		
ඵලදායී සන්නිවේදනය හා ආචාර විධි සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන	22	2025.08.26	මොබිටෙල් ආයතනයේ දී		
1970 නිලධාරීන් සඳහා අභ්‍යන්තර අංශ පිළිබඳ පුහුණු	5	2025 .08.04 – 08.21	1970 අංශයේදී		
විමධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ මාර්ගගත සැසිය (දමිළ මාධ්‍ය)	262	2025.09.09 පෙ.ව 9.00- පෙ.ව 11.00	මාර්ගගත		
මධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ මාර්ගගත සැසිය (දමිළ මාධ්‍ය)	262	2025.09.09 පෙ.ව 11.00 - ප.ව 1.00	මාර්ගගත		

විනයගරුක රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම උදෙසා මග පෙන්වීම පිළිබඳ පුහුණු වැඩසටහන	70	2025.09.19	79,995.00 14,400.00 (සම්පත්දායක දීමනාව)		
රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳ සාකච්ඡාවක්	869	2025.09.24	මාර්ගගත		දේශීය
විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් වන ගැටළු සාකච්ඡා කිරීමේ මාර්ගගත සැසිය	310	2025.10.14	මාර්ගගත		
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ද්වීතියික මට්ටමට අයත් නිලධාරීන් සඳහා ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් පැවැත්වීම	100	2025,11.20, 12/,18 හා ජනවාරි මස (දින 05ක්)	350,000.00		
රාජ්‍ය සේවය තුළ ධනාත්මක ආකල්ප වර්ධනය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම	64	2025.11.27	දෙපාර්තමේන්තු බිම් මහල් ශ්‍රවනාගාරයේදී		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන්ගේ පවතින ගැටළු සාකච්ඡා කිරීම	411	2025.12.11	මාර්ගගත		
රියදුරු මහතුන් සඳහා විනයානුකූල රිය ධාවනය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහනක් පැවැත්වීම	8	2025.12.12	(සංග්‍රහ වියදම්) 10,340.00 (සම්පත්දායක දීමනාව) 3600.00		
විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වන ගැටළු සාකච්ඡා කිරීම සඳහා වන මාර්ගගත සැසිය	300	2025.12.23	මාර්ගගත		
අධ්‍යයන පාඨමාලා සඳහා					
ඩී.බී.එස්. ජයසේකර මයාගේ පශ්චාත් උපාධි පාඨමාලාවේ පළමු වාරිකය ප්‍රතිපූර්ණය කිරීම	01		178,000.00		දේශීය

ඩී.බී.එස්. ජයසේකර මයාගේ පශ්චාත් උපාධි පාඨමාලාවේ දෙවන වාරිකය ගෙවීම (කොළඹ විශ්ව විද්‍යාලයට)	01		147,000.00		
ටී. ජනගන් මියගේ CIMA 2025 වාර්ෂික සමාජික ගාස්තුව ප්‍රතිපූර්ණය කිරීම	01		142,351.98		
ඊ.එම්. නාලිකා එදිරිසිංහ මියගේ පරිපාලන නීතිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සම්බන්ධ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වාරිකය ගෙවීම දෙවන වාරිකය ගෙවීම	01		20,000.00 33,500.00		
කුලාස් මියගේ පශ්චාත් උපාධි පාඨමාලාවේ පළමු වාරිකය ප්‍රතිපූර්ණය කිරීම	01		125,000.00		දේශීය
කුලාස් මියගේ පශ්චාත් උපාධි පාඨමාලාවේ දෙවන වාරිකය ගෙවීම (කොළඹ විශ්ව විද්‍යාලයට)	01		100,000.00		
Diploma in Professional English පාඨමාලාව සඳහා ගෙවීම් සිදුකිරීම. එස්. එම්. පෙත්තාවඩු මිය (විශ්‍රාම වැටුප් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්)	01		92,0000.00		
Diploma in Professional English පාඨමාලාව සඳහා ගෙවීම් සිදුකිරීම. කේ .පී .අයි .කුමාරි මිය (සහකාර අධ්‍යක්ෂ - විදේශ)	01		92,0000.00		

වෙනත් ආයතන මඟින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධ වීම

වැඩසටහනේ නම	පුහුණුකරන ලද සේවක සංඛ්‍යාව	පුහුණු වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේස්වභාවය (විදේශීය/දේශීය)
			දේශීය	විදේශීය	
විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම	3	2025.02.20	රු. 18,000.00 ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය		දේශීය
හානි පාඩු හා මු.රේ. 104 යටතේ වූ පරීක්ෂණ	3	2025.02.28 (පෙ.ව 8.45-ප.ව 4.00)	රු.19,500.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
රාජ්‍ය නිලධරයන්ටගේ වැටුප් විධිවිධාන සම්බන්ධ පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් 6 දෙනෙකු සහභාගී වීමට අදාළ ගෙවීම් (දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය)	6	2025.03.06	රු. 45,000.00 දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය		
වැටුප් පරිවර්තන පිළිබඳ පුහුණු වැඩසටහන	2	2025.03.17 හා 18	රු. 26,000.00 නිපුණතා සංවර්ධන අරමුදල		
නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය	1	2025.03.20	රු. 6500.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
කාර්යාල කළමනාකරණය හා මුදල් රේගුලාසි පුහුණුව	1	2025.03.20 හා 21	රු. 13,000.00 නිපුණතා සංවර්ධන අරමුදල		
විනය කාර්ය පටිපාටිය පුහුණු වැඩසටහන	1	දින 10	රු. 25,000.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
රාජ්‍ය සේවයේ උපාය මාර්ගික කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩමඩුව - 2025	1	2025.05.27	රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය		
හානි පාඩු හා මු.රේ. 104 යටතේ වූ පරීක්ෂණය	1	2025.06.19	රු. 6500.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		

නව ප්‍රසම්පාදන සංග්‍රහය පිළිබඳ දින 05 ක පුහුණු වැඩසටහන	2	2025.06.18,19,20,26 හා 27	ශ්‍රී ලංකා සංවර්ධනය පරිපාලන ආයතනය		
භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ	1	2025.06.26 හා 27	13,000.00 නිපුණතා සංවර්ධන අරමුදල		
ලංසු කැඳවීමේ ලේඛන පිළියෙල කිරීම	1	2025.06.30 හා 07.01	13,000.00 නිපුණතා සංවර්ධන අරමුදල		
රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ වැඩමුළුව	3	2025.07.08	22,500.00 දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය		
MS Excel පිළිබඳ වැඩමුළුව	8	2025.07.17 හා 18	112,000.00 දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය		
වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම, දෛනික ධාවනය සටහන් පොත් පිළිබඳ දැනුම ලබාදීමේ වැඩසටහන	1	2025.07.24	රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය		
අමාත්‍යංශයේ නිලධාරීන් සඳහා “AI for Transforming Public Service” වැඩමුළුව	5	2025.08.16	අරලියගහ මන්දිරයේදී		
පිළිගැනීමේ නිලධාරීන් සහ දුරකථන ක්‍රියාකරුවන් සඳහා නිපුණතා සංවර්ධනය පිළිබඳ වැඩසටහන	1	2025.08.20	රු. 6500.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම (ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයට)	1	2025.08.26	6500.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
Advanced Microsoft Excel Training for Data Analysis (නිලධාරීන් 3 සඳහා එක් අයෙකුට රු. 21000)	3	2025.08.18,19 හා 20	63,000.00 නිපුණතා සංවර්ධන අරමුදල		

“The secret of Success” වැඩමුළුව	1	2025.08.28	9900.00 Highflyer (PVT) Ltd		
නිවාඩුභාර නිලධාරියාගේ කාර්යභාරය	1	2025.09.12	6500.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
රාජ්‍ය වාහන නඩත්තුව	1	2025.09.23	6500.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් පරිවර්තන සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන	2	2025.09.26	13,000.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
“Speech craft” වැඩසටහන	1	2025 ඔක්තෝම්බර් මස සිට	35,000.00 ශ්‍රී ලංකා සංවර්ධනය පරිපාලන ආයතනය		
National IT Conference 2025 (NITC) 2025.10.16 වැඩසටහන සඳහා තොරතුරු තාක්ෂණ අංශයෙන් නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වීමට අදාළව **CSSL** ආයතනයට ගෙවීම් කිරීම	2	2025.10.16	30,000.00 ශ්‍රී ලංකා පරිගණක සංගමය (CSSL)		
මුද්‍රල් රේගුලාසි හා කාර්යාල කළමනාකරණය	5	2025. 11.03. හා 04	60,000.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
පුද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම	3	2025.12.08	19,500.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		
ආයතන සංග්‍රහය හා මුද්‍රල් රේගුලාසි සම්බන්ධ පුහුණුව	1	2025.12.15 හා 16	13,000.00 නිපුණතා සංවර්ධන අරමුදල		
ප්‍රසම්පාදනය සම්බන්ධ සහතික පත්‍ර පාඨමාලාව	1	2025.12.23	30,000.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය		

07.

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම			
1.6	වෙනත්			
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)**			
2.1	රා.ප.ව. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපති විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	කාල ප්‍රමාදයක් පවතී	
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මුදල් රෙගුලාසි 134 (2)DMA/1-2019 අනුව වසර ආරම්භයේදී	අනුකූල වේ		

	විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටුව**			
7.1	DMA චක්‍රලේඛ 1-2025 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුදල් රෙගුලාසි 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට වලඹීම	අනුකූල වේ		

12.	**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14.	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15.	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	අනුකූල වේ		

	වෙත ඉදිරිපත් කර තිබීම			
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ.	ආයතනයේ කාර්යභාරයට අනුකූලව සකස් කරන ලද පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වේ.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන	අනුකූල නොවේ.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	

	සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම		අංක 02/2018 (1)අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම" නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20.	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		



ශ්‍රී ලංකා විශ්‍රාම

இலங்கை ஓய்வு

Sri Lanka Pensions

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාළිගාවත්ත, කොළඹ 10

ஓய்வூதியத் திணைக்களம், மாளிகாவத்தை, கொழும்பு -10.

Department of pensions, Maligawaththa, Colombo 10

www.pensions.gov.lk